දේශීය ආදායම්-ශ්‍රී ලංකා
உள்நாட்டு இறைவரி-இலங்கை
Inland Revenue -Sri Lanka



# 2017

# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT

# දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ
# කාර්ය සාධන වාර්තාව

# 2017

අයිවන් දිසානායක

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

IRDSL

IRDSL

## 2017 වසර තුළ කාර්යසාධන සාරාංශය

2017 වසර තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද සමස්ත ආදායම රුපියල් මිලියන 836,518 ක් වූ අතර, එය කලින් වසරට වඩා රුපියල් මිලියන 194,971 ක වැඩිවීමක් පෙන්වයි. එමගින් රජයේ සමස්ත ආදායමට සියයට 45.67 ක දායකත්වයක් ලබාදුන් අතර, වසර තුළ දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය සියයට 6.29 ක් විය.

බදු අනුකූලතාවය ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසීමේ සහ සවිබල ගැන්වීමේ ක්‍රියාමාර්ග යන්ගෙන් සමන්විත ඒකාබද්ධ යාන්ත්‍රණයෙහි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිරත විය.

අනෙක් අතට වසර තුළ දී, බදු විගණන, හෙළිදරව් නොවූ ආදායම සහ පිරිවැටුම විධිමත් කිරීම සහ පැහැර හරින ලද බදු අයකර ගැනීමේ පනතට අතිරේක වශයෙන්, බදු අයකර ගැනීම සඳහා අදාළ ප්‍රඥප්තීන් හි දක්වා ඇති පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග සහ පියවර අඛණ්ඩව ගෙන ඇත.

තොරතුරු අංශය, බදු සේවා අංශය, සෙසු අංශ සහ ප්‍රාදේශීය කාර්යාල මගින් ලබා දෙන ලද මූලික ක්‍රියාමාර්ග සමඟ අලුත් බදු ලිපිගොනු සැලකිය යුතු සංඛ්‍යාවක් විවෘත කර ඇත.

ව්‍යවස්ථාවන් හි ඇතැම් විධිවිධාන සම්බන්ධයෙන් අවශ්‍ය මගපෙන්වීම් සහ උපදෙස් ලබාදීමට අතිරේක වශයෙන්, බදු නීති අර්ථනිරූපණය සඳහා වන කමිටුව විසින් වසර තුළ දී සිද්ධීන් 33 කට අදාළව අර්ථනිරූපණ ලබාදෙන ලදි.

2017 වසර තුළ දී දෙපාර්තමේන්තුවේ නවීකරණ වැඩ සටහන සමඟ පුළුල් පහසුකම් රැසක් සැලසීමට හැකිවන පරිදි බදු සේවා අංශය පූර්ණ නිපුනතාවයකින් යුතුව ශක්තිමත් කරන ලදි. ඒ අනුව, මීට පෙර විවිධ අංශ මගින් සිදු කරන ලද බදු ලියාපදිංචි කිරීම පහසු කිරීම සඳහා බදු ලියාපදිංචි කිරීමේ අංශය පිහිටුවන ලදි.

වර්ෂය තුළ දී උපකාර හා තොරතුරු අපේක්ෂා කරන සෑම තැනැත්තෙකුටම සහාය දැක්වීම සඳහා ව්‍යාපාර උපදේශන අංශය අවශ්‍ය නිලධාරීන්ගෙන් සමන්විතව ශක්තිමත් කරන ලදි.

2017 දී පුද්ගල ආදායම් බදු (IIT), හවුල් ව්‍යාපාර ආදායම් බදු (PIT) සහ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT FS) මොඩියුලයන් ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ව්‍යාපෘතිය යටතේ එළිදක්වනු ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා සහ උපලේඛන ඉදිරිපත් කිරීම විද්‍යුද්ගත අනුසාරයෙන් සිදු කිරීමට අවස්ථාව 2017 නොවැම්බර් මස සිට උදා වුණි.

IRDSL

## දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව පූර්ණ වශයෙන් පරිගණක ගත කරන ලද පද්ධතියකින් සමන්විත වූ බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ , ගෙවන්නා කෙරෙහි බදු හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත් වීම

## මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණපනත්වලට යටත්ව බදු අය කිරීම

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, එක සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම

## උපාය මාර්ග හා ඉලක්ක

ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම, ඊට අනුබල සැලසෙන වැඩ සටහන් ඔස්සේ බදු නීති රීති කෙරෙහි ඔවුන් ස්වේච්ඡාවෙන් එකඟ කරවා ගැනීම, වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හිදී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම

වැඩ කිරීමේ කාර්යක්ෂම ක්‍රම හා තාක්ෂණය යොදා ගැනීම මගින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරදැරි කරගෙන වඩාත් ඵලදායී අයුරින් දායක වීමට හැකි වනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්ය මණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම

IRDSL

## ප්‍රධාන නිලධාරීන්

---

**ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා** — **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

## නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන්

---

| | |
|---|---|
| **ඒ.එන්. ගුරුගේ මහතා** | බදු පරිපාලනය (සංස්ථාපිත, විශාල සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ) |
| **ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා** | බදු පරිපාලනය (සංස්ථාපිත, කුඩා පරිමාණ ව්‍යවසායයන්) |
| **පී. රෝහිණී මහත්මිය** | පාරිභෝගික සේවා සහ ප්‍රවර්ධන |
| **ආර්.එම්.පී.එස්.කේ. රාජපක්ෂ මහත්මිය** | අභියාචනා, විරෝධතා, ණය කළමනාකරණය සහ නීති |
| **සී.එච්. වීරසිංහ මිය** | මානව ප්‍රාග්ධන සහ වත්කම් පරිපාලනය |
| **එම්.ජී. සෝමචන්ද්‍ර මහතා** | බදු ආවේක්ෂණ, විමර්ශනය සහ මූල්‍ය බදු පරිපාලනය |
| **එච්.එම්.ඩී. මුණසිංහ මහත්මිය** | බදු අනුකූලතාවය සහ බලාත්මක කිරීම (සංස්ථාපිත, විශාල සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්) |
| **කේ.එස්.බී.ආර්.ඩී.එස්. කරුණාරත්න මිය** | බදු ප්‍රතිපත්ති සම්පාදනය සහ අන්තර් ජාතික කටයුතු |
| **එම්.එස්.එම්. ෆුවාර්ඩ් මහතා** | තොරතුරු සන්නිවේදන තාක්ෂණය පරිපාලනය සහ බදු මෙහෙයුම් සහාය |

## ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන්

---

| | |
|---|---|
| පී.එල්.එස්. ලියනගේ මහතා | පාරිභෝගික ලියාපදිංචිය සහ යාවත්කාලීන කිරීම |
| ඒ.ඒ. දයාරත්න මහතා | බදු අනුකූලතාවය සහ බලාත්මක කිරීම (සංස්ථාපිත මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්) |
| ඊ.එස්. ද සොයිසා මහතා | කලාප I |
| එච්.එම්.ඩබ්.සී. බණ්ඩාර මහතා | කලාප III |
| ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා | මානව සම්පත් සංවර්ධනය, වෙනස් වීම් කළමනාකරණය සහ බදු ගිවිසුම් |
| ඩබ්.එම්.පී.එන්.බී. වනිගසේකර මහතා | අනුකූලතා සහාය සේවා සහ ප්‍රවර්ධනය |
| එම්.ජේ. ගුණසිරි මහතා | විමර්ශනය |
| ඩී. රන්ගල්ල මහතා | විශාල සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන අභියාචනා සහ විරෝධතාවන් |
| ආර්.එම්. ජයසිංහ මහතා | ස්වාධීන අභ්‍යන්තර කාර්යයන් පාලනය |
| එම්.එච්. ඩෙන්සිල් මහතා | කලාප II සහ ඒකක VIP සහ RTP |
| යූ.බී. වක්කුඹුර මහතා | රඳවා ගැනීමේ බදු, උපයන විට ගෙවීම, මුද්දර ගාස්තු සහ ඔට්ටු හා සූදු බදු |
| ජේ.ඒ.ජී. මහින්දරත්න මහතා | විශාල හා මධ්‍ය පරිමාණ සංස්ථාපිත ව්‍යාපාර ව්‍යවසායයන් |
| බී.ජේ. ජයරත්න මහතා | නෛතික කටයුතු සහ පැහැර හරිනු ලබන බදු රැස් කිරීම |
| එම්.එල්.එම්. තාහීර් මහතා | මානව සම්පත් කළමනාකරණය |
| කේ.ඩී.එම්. රත්නකුමාර මහතා | ප්‍රසම්පාදනය, වත්කම් කළමනාකරණය සහ බදු මෙහෙයුම් සහාය |
| ජී.සී. මහානාම මහතා | විගණන, විශාල පරිමාණ ව්‍යාපාර ව්‍යවසායයන් සහ පැරණි පද්ධති |
| කේ.ඩී.එම්.එන්. ගුණතිලක මහතා | බදු අනුකූලතාවය සහ බලාත්මක කිරීම - සංස්ථාපිත මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් |
| එස්.එස්.ඩී. වීරසේකර මහතා | ජාත්‍යන්තර හා අභ්‍යන්තර කටයුතු සම්බන්ධව නීති සම්පාදනය |
| ටී. රාජපක්ෂ මහතා | විගණන - මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යවසායයන් |
| එම්.එස්.එම්. සියාන් මහතා | තොරතුරු තාක්ෂණය පරිපාලනය සහ ගෙවීම් පාලනය |
| යූ.පී.එස්.ඒ. ජයලත් මහතා | මිල පැවරුම් නියෝග සහ අර්ථික පර්යේෂණ |
| එම්.ඩී.ජේ.එම්. දේවප්‍රිය මහතා | තොරතුරු සහ අන්තර් නියෝජ්‍යායතන |

## වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද අණ පනත් අනුව පනවන ලද බදු පහත දැක්වේ.

| බද්ද | අදාළ අණ පනත් |
|---|---|
| ආදායම් බදු | 2007 අංක 10, 2008 අංක 9 , 2009 අංක 19 2011 අංක 22, 2012 අංක 8, 2013 අංක 18, 2014 අංක 8 සහ 2015 අංක 9 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත |
| එකතු කළ අගය මත බදු, (මූල්‍ය සේවා මත වූ එකතු කළ අගය මත බදු, එකතු කළ අගය මත වූ අත්තිකාරම් බදු, විකල්ප එකතු කළ අගය මත බදු ඇතුළත්ව) | 2003 අංක 07, 2004 අංක 13, 2005 අංක 06, 2006 අංක 08 සහ 49, 2007 අංක 14, 2008 අංක 15, 2009 අංක 15, 2011 අංක 09, 2012 අංක 7, 2013 අංක 17, 2014 අංක 7, 2015 අංක 11 සහ 2016 අංක 20 දරන පනත් මගින් සංශෝධිත පරිදි 2002 අංක 14 දරන එකතු අගය මත බදු පනත |
| ආර්ථික සේවා ගාස්තුව | 2007 අංක 15, 2008 අංක 11, 2009 අංක16, 2011 අංක 11, 2012 අංක 11, 2013 අංක 6, 2014 අංක 9 සහ 2015 අංක 13 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009 අංක 32, 2011 අංක 10, 2012 අංක 9, 2013 අංක 11, 2014 අංක 10, 2015 අංක 12 සහ 2016 අංක 21 පනත් මගින් සංශෝධිත 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත |
| ඔට්ටු හා සූදු බදු | 2015 අංක 14 පනත මගින් සංශෝධිත 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සහ 2008 අංක 10 සහ 2011 අංක 13 දරන පනත් මගින් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත |
| කොටස් ගනුදෙනු බද්ද | 2005 අංක 05 දරන මුදල් පනත සහ 2007 අංක 13 දරන මුදල් පනත |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත, 2006 අංක 11 දරන මුදල් පනත සහ 2008 අංක 08 දරන මුදල් පනත |
| සමාජ වගකීම් බද්ද | |
| ඉඩම් පැවරීම මත බද්ද | 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත |

කලින් පනවනු ලැබ දැනට අවලංගු කර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් තක්සේරු සහ අය කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතික ආරක්ෂක බද්ද | 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බද්ද, සංශෝධිත පරිදි |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත, සංශෝධිත පරිදි |
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක බද්ද, සංශෝධිත පරිදි |
| පිරිවැටුම් බද්ද (උතුරු පළාත) | සංශෝධිත පරිදි 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත |

IRDSL

## පටුන


| | |
|---|---|
| **2017 වසර තුළ කාර්ය සාධන සාරාංශය** | III |
| **ප්‍රධාන නිලධාරීන්** | VII |
| **වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු** | IX |
| **පටුන** | XI |
| **I කොටස - මානව සම්පත් කළමනාකරනය සහ සංවර්ධනය** | **1** |
| පරිච්ඡේදය 1 මානව සම්පත් | 3 |
| 1.1 අනුමත කාර්ය මණ්ඩලය සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව | 5 |
| 1.2 උසස් කිරීම් | 6 |
| 1.3 විශ්‍රාම ගැනීම් | 6 |
| 1.4 පුහුණු කිරීම | 8 |
| **II කොටස - බදු පරිපාලනය** | **15** |
| පරිච්ඡේදය 2 ආදායම් රැස්කිරීම | 17 |
| 2.1 බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව | 19 |
| 2.2 මුළු ආදායම් රැස්කිරීම | 19 |
| 2.3 මුළු ආදායම් ප්‍රවාහය | 21 |
| 2.4 ආදායම පෙර වසර සමඟ සැසඳීම | 22 |
| 2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම | 23 |
| 2.6 ආදායම් රැස්කිරීම් - ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් පදනම් | 23 |
| 2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය | 24 |
| 2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය | 25 |
| 2.9 ආදායම් බදු රැස්කිරීම | 26 |
| 2.10 එකතු කළ අගය මත බදු රැස්කිරීම. | 27 |
| 2.11 ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම් | 29 |
| 2.12 ආර්ථික සේවා ගාස්තු රැස්කිරීම | 30 |
| 2.13 උපයන විට ගෙවීමේ බදු රැස්කිරීම | 31 |
| 2.14 රඳවා ගැනීමේ බදු (පොළිය සහ නිශ්චිත ගාස්තු මත) | 32 |
| 2.15 ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම | 32 |
| 2.16 වාහන හිමිකම් බද්ද | 32 |
| 2.17 මුද්දර බදු රැස්කිරීම | 33 |
| 2.18 දේශීය ආදායම් රැස්කිරීම 2013 සිට 2017 දක්වා (බදු වශයෙන්) | 33 |
| පරිච්ඡේදය 3 වියදම් සහ ඵලදායිතා අනුපාතය | 35 |
| 3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම් 2015, 2016 සහ 2017 වර්ෂ සමඟ සැසඳීම | 37 |
| 3.2 ඵලදායිතා අනුපාතය | 38 |
| 3.3 අභ්‍යන්තර විගණනය | 39 |
| පරිච්ඡේදය 4 පැහැර හරින ලද බදු | 41 |
| 4.1 පැහැර හරින ලද බදු | 43 |
| 4.2 පැහැර හරින ලද බදු අඩු කිරීම සඳහා සැලසුම් | 44 |
| 4.3 හිඟ බදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම. | 44 |
| පරිච්ඡේදය 5 විගණන, අතිරේක බදු රැස් කිරීම, ආපසු ගෙවීම්, අය කර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා | 45 |
| 5.1 විගණන | 47 |
| 5.2 අභියාචනා | 47 |
| 5.3 අය ක්‍රියා මාර්ග | 48 |
| 5.4 ආපසු ගෙවීම් | 48 |
| පරිච්ඡේදය 6 ජාත්‍යන්තර සබඳතා | 49 |
| 6.1 ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් | 51 |
| 6.2 අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වයන් | 53 |
| පරිච්ඡේදය 7 ව්‍යවස්ථා සම්පාදනය | 55 |


IRDSL

7.1 වසර තුළදී පනවන ලද ව්‍යවස්ථාවන් 57
7.2 අනුමත පුණ්‍යායතන 57
7.3 ගැසට් නිවේදන 57
7.4 අර්ථ නිරූපණ කමිටුව 58

පරිච්ඡේදය 8 අනෙකුත් කාර්යයන් 59
8.1 බදු සේවා 61
8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විධානයන් සහ නිෂ්කාශන සහතික පත් පිළිබඳ විස්තර 61
8.3 මිල පැවරුම් නියෝග අංශය 62
8.4 මානව සම්පත් අංශය 62

පරිච්ඡේදය 9 ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) 65

IRDSL

# කොටස I

IRDSL

# මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය

IRDSL

# පරිච්ඡේදය 1

# මානව සම්පත්

IRDSL

IRDSL

## 1:1 අනුමත කාර්ය මණ්ඩලය සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව

2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වෙන වගුව මගින් පෙන්නුම් කරයි.

වගුව **1.1 2017.12.31** දිනට කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | සේවයේ නිරත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| **දේශීය ආදායම් සේවය** | **1,234** | **1,162** | **72** |
| කොමසාරිස් ජනරාල් | 1 | 1 | - |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 9 | 7 | 2 |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 22 | 14 | 8 |
| කොමසාරිස් | 90 | 81 | 9 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් / නියෝජ්‍ය කොමසාරිස් / සහකාර කොමසාරිස් | 1,107 | 1,057 | 50 |
| ජ්‍යෙෂ්ඨ බදු නිලධාරී / බදු නිලධාරී | 5 | 2 | 3 |
| **අනෙකුත් සේවා** | **1,542** | **1,362** | **182** |
| **ඒකාබද්ධ සේවය** | **1,391** | **1,272** | **129** |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | 1 | 1 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - |
| අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 1 | - |
| ගණකාධිකාරී | 5 | 4 | 1 |
| පරිපාලන නිලධාරී | 3 | 3 | - |
| භාෂා පරිවර්තක | 9 | 9 | - |
| සංවර්ධන නිලධාරී | 7 | 7 | - |
| පුස්තකාලයාධිපති | 1 | - | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 925 | 820 | 105 |
| ප්‍රවාහන නිලධාරී | 1 | - | 1 |
| රියදුරු | 86 | 81 | 5 |
| කාර්යාල සේවක සේවය | 349 | 333 | 16 |
| **තොරතුරු සංනිවේදන තාක්ෂණ සේවය** | **132** | **84** | **48** |
| අධ්‍යක්ෂ (තොරතුරු සංනිවේදන තාක්ෂණ) | 2 | 1 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (තොරතුරු සංනිවේදන හා තාක්ෂණ) | 6 | 6 | - |
| පද්ධති විශ්ලේෂක | 1 | 1 | - |
| තොරතුරු සංනිවේදන තාක්ෂණ නිලධාරී | 18 | 12 | 6 |
| තොරතුරු සංනිවේදන තාක්ෂණ සහකාර | 105 | 64 | 41 |
| **අනෙකුත්** | **19** | **16** | **5** |
| ඉංජිනේරු | 1 | 1 | - |
| තාක්ෂණ නිලධාරී | 2 | - | 2 |
| ගොඩනැගිලි අධීක්ෂක | 1 | - | 1 |
| පර්යේෂණ සහකාර | 10 | 10 | - |
| පිළිගැනීමේ නිලධාරී | 4 | 3 | 1 |
| වඩු කාර්මික | 1 | - | 1 |
| සනීපාරක්ෂක කම්කරු | | 2 | - |
| එකතුව | **2,773** | **2,553** | **225** |

## 1.2 උසස් කිරීම්

- කොමසාරිස්වරුන් දස දෙනෙකු ජ්‍යෙෂ්ඨ කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන් දොළොස් දෙනෙකු කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- නියෝජ්‍ය කොමසාරිස්වරුන් එකොළෙස් දෙනෙකු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- සහකාර කොමසාරිස්වරුන් දෙසිය අනූ දෙනෙකු නියෝජ්‍ය කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.

## 1.3 විශ්‍රාම ගැනීම්

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වසර තුළ දී විශ්‍රාම ගැනීමට යෙදුණි.

- කේ. දහනායක මහත්මිය - කොමසාරිස් ජනරාල්
- ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා - නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්
- ජී.ඩී.පී.ඩබ්. ගුණතිලක මෙනවිය - නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්
- බී.ඒ.ඩී.ඩී. හේරත් මහත්මිය - නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්
- ජේ. රත්නායක මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
- ඕ.පී.කේ.කේ. සිරිසේන මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
- කේ.ඒ.ඩී.පී. කෝරලේආරච්චි මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
- ඩී.බී. දිසානායක මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
- ඩබ්.එස්.කේ. ද කොස්තා මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
- ඩී.එම්.පී. ගනේපොල මහත්මිය - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්

**අනෙකුත් විශ්‍රාම ගැනීම්**

- කොමසාරිස් 02
- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් 04
- නියෝජ්‍ය කොමසාරිස් / සහකාර කොමසාරිස් 02
- පරිපාලන නිලධාරි 01
- කළමණාකරණ සහකාර 20
- කාර්යාල කාර්ය සහායක 18
- රියදුරු 09

**කේ. දහනායක මහත්මිය**

කේ. දහනායක මහත්මිය තක්සේරු නිලධාරිනියක ලෙස 1981 දී දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වූවාය. 2017.06.22 වන දින ඇය විශ්‍රාම ගන්නා කාලවකවානුවේ දී මෙම දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් තනතුර හෙබවීය. දේශීය ආදායම් සේවයේ විවිධ තනතුර හොබවමින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් වසර 36 ක කාලයක කැපවුණු සේවා කාලපරිච්ඡේදයක් නිම කර තිබුණි. මෙතුමියගේ ධූර කාලය තුළ 2006 වසරේදී ඇමරිකා

එක්සත් ජනපදයේ e-වාණිජ්‍ය සහ e-ව්‍යාපාර සංවර්ධන වැඩසටහන, 2011 වසරේදී සිංගප්පූරුවේ පැවැති, බදු අභියාචනා සහ අර්ථකථන කොමිසම විසින් සංවිධානය කළ බදු අධිකාරී වැඩසටහන, වර්ෂ 2012 දී ආසියානු බදු අධිකාරී සිම්පෝසියම විසින් මැලේසියාවේ දී පවත්වන ලද බදුකරණයේ ප්‍රති වැළැක්වීමේ නීති පිළිබඳ වැඩසටහන, 2015 වසරේදී ඉහළ මට්ටමේ නිලධාරීන් සඳහා බදු පරිපාලනය පිළිබඳව නෙදර්ලන්තයේ දී පවත්වන ලද වැඩමුළුව සහ 2016 දී මෙක්ෂිකෝවේ පැවැති හුවමාරු මිලකරන ප්‍රලේඛනය සහ රටින් රට වාර්තාකාරණය පිළිබඳ OECD වැඩමුළුව යනාදී වැඩසටහන් බොහෝමයකට සහභාගී වූවාය. තව ද මෙතුමිය 2013 දී ඩෙන්මාර්කයේ පවත්වන ලද 67 වන IFA කොංග්‍රසයට ද 2015 සහ 2017 වර්ෂයන්හි දී එක්සත් රාජධානියේ පවත්වන ලද CATA වාර්ෂික මහා කමිටු රැස්වීමට ද, 2016 දී කොරියාවේ පවත්වන ලද IFA ආසියානු පැසිපික් කලාපීය සම්මේලනයට ද දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගි වූ අතර ශ්‍රී ලංකාව හා ස්විස්ටර්ලන්තය සහ ශ්‍රී ලංකාව හා චෙක් රජය අතරද ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්වලට අදාළ කටයුතුවලට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූවාය.

<u>**ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා**</u>

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වර්ෂ 1984 දී තක්සේරු නිලධාරියෙකු ලෙස බැඳුනු ජේ.පී.ආර්.ඩී. ජයසේකර මහතා 2016 දී නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් ධුරයට පත්විය. මෙතුමා වසර 33 ක කැපවුණු සේවා කාලපරිච්ඡේදයක් නිම කර 2017 ඔක්තෝබර් මස 16 වන දින සේවයෙන් විශ්‍රාම ලැබුවේය. ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා සිය සේවා කාලය තුළ වර්ෂ 2001 දී ඔස්ට්‍රියාවේ පැවති බදු නිරූපන වැඩමුළුව, වර්ෂ 2000 දී එක්සත් රාජධානියේ පැවති උසස් කළමනාකරණ විභව පුහුණු වැඩසටහන, වර්ෂ 2007 දී ඉන්දියාවේ පැවති විගණන හා කළමනාරණය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන, වර්ෂ 2012 දී ඇන්ගෝලාවේ රේගු විස්තාරණ නවීකරණය පිළිබඳ පශ්චාත් සම්ප්‍රජනාතා වැඩසටහන සහ 2016 දී මෙක්සිකෝවේ පැවති බදුකරණය හා පතල් ඛණිජ කර්මාන්තය, හුවමාරු මිල හා අනිකුත් බදු අවදානම් පිළිබඳ වැඩමුළුව වැනි විදේශයන් හි පැවති බදුකරණ වැඩසටහන් සහ පුහුණු සැසියන් සඳහා සහභාගි විය. එසේම වර්ෂ 2012 දී ප්‍රංශයේ පැවති එකතු කළ අගය මත බද්ද පිළිබඳ ගෝලීය සංසදයේ පළමු රැස්වීමට ද වර්ෂ 2013 දී ජපානයේ පැවති හතරවන ඉහළ මට්ටමේ බදු සම්මේලනයට ද, වර්ෂ 2014 දී චීනයේ පැවති ශ්‍රී ලංකා හා චීන රජය අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡාවට ද, සී ෂෙල්ස් හා සවුදි අරාබි සමඟ ද්විත්ව බදුකරණ වැළැක්වීමේ ගිවිසුම් සඳහා පවත්වන ලද සාකච්ඡාවන්ට ද දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගි විය. තවද දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙහි ලා විශේෂ සේවාවක් මෙතුමා විසින් සිදු කරන ලදී.

<u>**ඩී.ජී.පී.ඩබ්ලිව්. ගුණතිලක මෙනවිය**</u>

ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මෙනවිය වර්ෂ 1984 දී තක්සේරු නිලධාරිනියක ලෙස දෙපාර්තමේන්තුවට එක් වූවාය. 2017.11.27 වන දින විශ්‍රාම යන විට මෙතුමිය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් ධුරය හෙබවූවාය. දේශීය ආදායම් සේවයේ විවිධ තනතුරු හොබවමින්

දෙපාර්තමේන්තුව වෙනුවෙන් වසර 33 ක කැපවුණු සේවා කාලපරිච්ඡේදයක් නිම කර තිබුණි. ඇයගේ සේවා කාලය තුළ වර්ෂ 2006 දී සිංගප්පූරුවේ පැවති මූල්‍යාමය බදු පිළිබඳ සමුළුව, වර්ෂ 2007 දී ඔස්ට්‍රියාවේ පැවති ද්විත්ව බදු සහන ගිවිසුම පිළිබඳ සමුළුව, වර්ෂ 2011 දී සිංගප්පූරුවේ පැවති බදු අභියාචනා කොමිසම සහ අර්ථ නිරූපන කොමිසම විසින් සංවිධානය කරන ලද බදු අධිකාරිය පිළිබඳ වැඩසටහන, වර්ෂ 2013 දී මැලේසියාවේ පැවති IRBM – OECD බදු ප්‍රතිපත්ති විශ්ලේෂණ වැඩසටහන, වර්ෂ 2014 දී මැලේසියාවේ පැවති උසස් මිල පැවරුම් සිද්ධි අධ්‍යයන වැඩසටහන සහ 2017 දී සිංගප්පූරුවේ පැවති e - පාලනය සහ තොරතුරු තාක්ෂණ පද්ධති කළමනාකරණ වැඩසටහන වැනි විදේශයන්හි පැවැත්වුණු බදුකරණ වැඩසටහන් සඳහා සහභාගි වූවාය. තවද වර්ෂ 2005 දී ඉතාලියේ පැවති ජාත්‍යන්තර බදු සංවාද එකතු කළ අගය මත බද්ද සමුළුවට ද, වර්ෂ 2011 දී ඉන්දියාවේ පැවති බදු හා අසමානතා පිළිබඳ හතරවන ITD ගෝලීය සම්මේලනයට ද, වර්ෂ 2014 ප්‍රංශයේ පැවති OECD වාර්ෂික බදු ගිවිසුම් රැස්වීමට ද ශ්‍රී ලංකාව හා සිංගප්පූරුව සහ ශ්‍රී ලංකාව හා පින්ලන්තය අතර ද්විත්ව බදුකරණ වැළැක්වීමේ ගිවිසුම් සම්පාදන කටයුතුවල සාකච්ඡාවන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගි වූවාය. එසේම 2014 සිට 2017 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පාලනය කරන ලද ව්‍යවස්ථාවන් හි විධිවිධාන අර්ථකථනය කිරීම සඳහා වගකීම දරන බදු නීතීන් හා අර්ථ නිරූපන කමිටුවේ සභාපති ධූරය මෙතුමිය විසින් හොබවන ලදී. දේශීය ආදායම් නිලධාරීන් හට අභ්‍යන්තර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඇය ඉමහත් සේවාවක් ඉටු කළාය.

## 1.4 පුහුණු කිරීම්

### 1.4.1 සේවාස්ථ පුහුණුව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන අංශය විශේෂයෙන්ම බදුකරණය සහ ගිණුම්කරණය පිළිබඳව දැනුම ඉහළ නැංවීම සහ විශ්ලේෂණාත්මක හැකියාව ඔප්නැංවීම අපේක්ෂාවෙන් සහකාර කොමසාරිස්වරුන් වෙනුවෙන් පුහුණු පාඨමාලාවන් සහ විභාග නිරන්තරයෙන් පවත්වනු ලැබේ. නිලධාරීන් අදාළ ශ්‍රේණිවල ස්ථිර කිරීමට අවශ්‍ය විවිධ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා රාජකාරී ඉටු කිරීමට අවශ්‍ය දැනුම ලබා ගැනීම සඳහාත් අවශ්‍ය කෙරෙන විෂයය අරමුණු කොට ගෙන මෙම පුහුණු පාඨමාලා සකසා ඇත.

වසර තුළදී පුහුණු කරන ලද පිරිස් සහ පවත්වන ලද පරීක්ෂණ පිළිබඳ විස්තර පහත පරිදි දැක්වේ.

- සහකාර කොමසරිස්වරුන් සඳහා

වගුව 1.2 වසර තුළදී පවත්වන ලද පුහුණු වැඩසටහන් සහ පරීක්ෂණ පිළිබඳ විස්තර

| පාඨමාලාව / පරීක්ෂණය | පුහුණු කරන ලද සංඛ්‍යාව |
|---|---|
| පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා III ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් වෙනුවෙන් පවත්වන ලද පුහුණු පන්ති (දෙවන කාණ්ඩායම) | සිංහල මාධ්‍ය - 90<br>දෙමළ මාධ්‍ය - 07<br>ඉංග්‍රීසි මාධ්‍ය - 04 |
| දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා III ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් වෙනුවෙන් පවත්වන ලද පුහුණු පන්ති | සිංහල මාධ්‍ය - 379<br>දෙමළ මාධ්‍ය - 14<br>ඉංග්‍රීසි මාධ්‍ය - 21 |

| | | |
|---|---|---|
| III ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | දෙවන ප්‍රයත්නය | සිංහල මාධ්‍ය - 210<br>දෙමළ මාධ්‍ය - 08<br>ඉංග්‍රීසි මාධ්‍ය - 257 |
| III ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | තුන්වන ප්‍රයත්නය | සිංහල මාධ්‍ය - 18<br>දෙමළ මාධ්‍ය - 00<br>ඉංග්‍රීසි මාධ්‍ය - 01 |
| III ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (දෙවන කණ්ඩායම) | තුන්වන ප්‍රයත්නය | සිංහල මාධ්‍ය - 81<br>දෙමළ මාධ්‍ය - 04<br>ඉංග්‍රීසි මාධ්‍ය - 06 |

**වගුව 1.3 වසර තුළදී පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු යනාදිය**

| විෂය | වසර තුළ පවත්වන ලද සම්මන්ත්‍රණ / වැඩමුළු යනාදිය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| බදු පරිපාටිය පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | 95 |
| බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය | 02 | 86 |
| බදුකරණයෙහි ජාත්‍යන්තර සබඳතා පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | 94 |
| කොටස් වෙළඳපොළ පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | 92 |
| කුඩා ව්‍යවසායන් සඳහා, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත පිළිබඳ සම්මන්ත්‍රණය | 03 | 246 |

- **පරිගණකගත කරන ලද ගිණුම්කරණ පැකේජයන් (Package) පිළිබඳ පුහුණුව**

  දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණ පෙරදැරිව පරිගණකගත කරන ලද ගිණුම්කරණ පැකේජයට අදාළව පුහුණු වැඩසටහනක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 30 දෙනෙකු සඳහා AAT ආයතනයේ සහයෝගීත්වයෙන් පවත්වන ලදී.

### 1.4.2 විදේශ පුහුණුව

බදු පරිපාලකයින් වශයෙන් නිලධාරීන්ගේ ඉහළ වෘත්තීය මට්ටම් පවත්වා ගෙන යාම පිණිස වෙනත් රටවල බදු නීති පරිපාලනය සහ මනා පරිචයන්හි කරන ලද ප්‍රගමනයන්ට ඔවුන් නැඹුරු කරවීමේ අරමුණ පෙරදැරිව විදේශයන්හි පැවති පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගිවීමට ඉඩ සැලසෙන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙනුවෙන් අවශ්‍ය කටයුතු සලසා දෙන ලදී.

එසේ විදේශයන් සඳහා යවන ලද නිලධාරීන් සහ ඔවුන් සහභාගි වූ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**වගුව 1.4 වසර තුළදී සහභාගි වූ විදේශ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ වැඩසටහන් පිළිබඳ විස්තර**

| අංකය | නම සහ තනතුර | වැඩසටහන | රට | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 01 | ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා - (කොමසාරිස් ජනරාල්) | "ප්‍රතිපත්තියේ සිට නීති සම්පාදනය දක්වා" නම් වූ වැඩමුළුව | එක්සත් රාජධානිය | 15.09.2017-23.09.2017 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා- (කොමසාරිස් ජනරාල්) | 2017 OECD - සංස්ථාපිත ණය පරිපාලනය සඳහා ආසියානු වටමේසය | ජපානය | 18.10.2017-22.10.2017 |
| 03 | එම්.ජී. සෝමචන්ද්‍ර මහතා - නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 2017 OECD - සංස්ථාපිත ණය පරිපාලනය සඳහා ආසියානු වටමේසය | ජපානය | 18.10.2017-22.10.2018 |
| 04 | ආර්.ජී.ඩී.එස්.බී.පෙරේරා මිය- ප්‍රධාන ගණකාධිකාරී | PIM - ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 20.08.2017-22.10.2017 |
| 05 | එන්.ඒ.එච්.කේ. විජේරත්න මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක | PIM - ජාත්‍යන්තර කළමනාකරණ වැඩසටහන | තායිලන්තය | 20.08.2017-22.10.2018 |
| 06 | පී.එල්.එස්. ලියනගේ මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ආසියානු සහ පැසිපික් කලාපය සඳහා පදනම ක්ෂයවීම සහ ලාභ විතැන්වීම පිළිබඳ අන්තර්ගත කාර්ය රාමුව පිළිබඳ දෙවන රැස්වීම | ප්‍රංශය | 24.01.2017-28.01.2017 |
| 07 | ඊ.එස්. ද සොයිසා මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | OECD - සැලසුමෙන් අනුගත වීම (MTC අවස්ථා) | හන්ගේරියාව | 15.10.2017-22.10.2017 |
| 08 | එච්.එම්.ඩබ්.සී. බණ්ඩාර මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ප්‍රධාන පරිවර්තනය : සංස්කෘතික පරිවර්තනය: ජනතාව,ආකල්ප සහ චර්යාව පිළිබඳ වැඩමුළුව | එක්සත් රාජධානිය | 11.11.2017-19.11.2017 |
| 09 | එච්.එම්. ඩෙන්සිල් මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | OECD - සැලසුමෙන් අනුගත වීම (MTC අවස්ථා) | හන්ගේරියාව | 15.10.2017-22.10.2017 |
| 10 | යූ.බී. වක්කුඹුර මහතා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | OECD - සැලසුමෙන් අනුගත වීම (MTC අවස්ථා) | හන්ගේරියාව | 15.10.2017-22.10.2018 |
| 11 | ටී. රාජපක්ෂ මහතා - කොමසාරිස් | OECD - බදු ප්‍රතිපත්ති විශ්ලේෂණය සහ ආදායම් සංඛ්‍යාත (MTC අවස්ථා) | කොරියාව | 19.03.2017-25.03.2017 |
| 12 | එන්.එම්.එම්. මිෆ්ලි මහතා - කොමසාරිස් | BEPS සඳහා විගණන MNGE'S සිද්ධි අධ්‍යයන වැඩමුළුව | මෙක්සිකොව | 25.11.2017-03.12.2017 |
| 13 | එස්.එම්.ඒ. බණ්ඩාර මහතා - කොමසාරිස් | පශ්චාත් රාජ්‍ය කළමනාකරණ වැඩසටහන් හි දෙවන රාජ්‍ය අධ්‍යයන චාරිකාව (MPM) - 2016 | චීනය | 27.02.2017-11.03.2017 |
| 14 | එස්.එම්.ඒ. බණ්ඩාර මහතා - කොමසාරිස් | විමර්ෂණය සහ බුද්ධිමය එක් රැස් කිරීම සඳහා නවීන තාක්ෂණයන් පිළිබඳ වැඩමුළුව | ඉන්දියාව | 21.08.2017-25.08.2017 |
| 15 | එල්.එම්.සී. වීරකෝන් මිය - කොමසාරිස් | අන්තර්ජාල මූල්‍ය අරමුදලේ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අන්තර්ජාතික VAT/GST වැඩමුළුව SARTTAC | ඉන්දියාව | 24.09.2017-30.09.2017 |
| 16 | එච්.ටී.කේ.එන්.පීරිස් මහතා - කොමසාරිස් | OECD - බදු ප්‍රතිපත්ති විශ්ලේෂණය සහ ආදායම් සංඛ්‍යාත (MTC අවස්ථා) | කොරියාව | 19.03.2017-25.03.2017 |
| 17 | යූ.එච්.එම්. අයිරාංගනී මිය - කොමසාරිස් | පශ්චාත් රාජ්‍ය කළමනාකරණ වැඩසටහන් හි දෙවන රාජ්‍ය | චීනය | 18.05.2017-29.05.2017 |

| | | | | |
|---|---|---|---|---|
| | | අධ්‍යයන චාරිකාව (MPM) - 2016 | | |
| 18 | ඒ.ඩී.අයි.එස්. අබේසේකර මිය - කොමසාරිස් | ආදායම් බදු වැඩමුළුව | චීනය | 05.03.2017-11.03.2017 |
| 19 | එච්.ඒ. ලලිතා රංජනී මහත්මිය - කොමසාරිස් | පශ්චාත් රාජ්‍ය කළමනාකරණ වැඩසටහන් හි දෙවන රාජ්‍ය අධ්‍යයන චාරිකාව (MPM) - 2016 | චීනය | 27.02.2017-11.03.2017 |
| 20 | ඩබ්.එස්. තිලකරත්න මහතා - කොමසාරිස් | OECD – BEPS සඳහා විගණන MNES (MTC අවස්ථා) | හන්ගේරියාව | 26.03.2017-02.04.2017 |
| 21 | එම්.ජේ. පෙරේරා මහතා - කොමසාරිස් | SME මත අවධානයයොමු කරමින් බදු අනුකූලතාවයන් කළමනාකරණය | චීනය | 09.04.2017-16.04.2017 |
| 22 | කේ.ජී.පී.කේ. ධර්මවර්ධන මහතා - කොමසාරිස් | OECD – BEPS සඳහා විගණන MNES (MTC අවස්ථා) | හන්ගේරියාව | 26.03.2017-02.04.2017 |
| 23 | එම්.කේ.පී.ජේ.එස්.එස්. පෙරේරා මහතා - කොමසාරිස් | OECD – BEPS සඳහා විගණන MNES (MTC අවස්ථා) | හන්ගේරියාව | 26.03.2017-02.04.2018 |
| 24 | අයි.වී. ජයරත්න මහතා - කොමසාරිස් | BEPS සඳහා විගණන MNES සිද්ධි අධ්‍යයන වැඩමුළුව | මෙක්සිකෝව | 25.11.2017-03.12.2017 |
| 25 | යූ.පී.ආර්. දමයන්ති මෙනවිය - ගණකාධිකාරී | ක්‍රමෝපායික කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | ඉන්දුනීසියාව | 14.05.2017-21.05.2017 |
| 26 | යූ.එල්.සී. පෙරේරා මෙනවිය - ගණකාධිකාරී | ක්‍රමෝපායික කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | ඉන්දුනීසියාව | 14.05.2017-21.05.2017 |
| 27 | යූ.පී. විජයසේවා මිය - ගණකාධිකාරි | රාජ්‍ය ප්‍රසම්පාදන සහ ගිවිසුම් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව (DIPPCA) පාඨමාලාවේ කොටසක් පමණක් සම්පූර්ණ කිරීම - දෙවන රාජ්‍ය අධ්‍යයන චාරිකාව | එක්සත් රාජධානිය | 14.11.2017-26.11.2017 |
| 28 | ඩී.එම්.එන්.ඩී. දහනායක මිය - කොමසාරිස් (වැඩබලන) | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අන්තර් ජාතික VAT/GST වැඩමුළුව SARTTAC | චීනය | 24.09.2017-30.09.2017 |
| 29 | ඩබ්.ඒ.ඩී.ඩී. වලිමිණී මහතා - කොමසාරිස් | BEPS සඳහා විගණන MNES සිද්ධි අධ්‍යයන වැඩමුළුව | මෙක්සිකෝව | 25.11.2017-03.12.2017 |
| 30 | එස්.අයි. වීරවර්ධන මෙනවිය - නියෝජ්‍ය කොමසාරිස් | ආදායම් බදු සමුළුව | චීනය | 05.03.2017-11.03.2017 |
| 31 | ඒ.කේ. වික්‍රමසූරිය මහතා - නියෝජ්‍ය කොමසාරිස් | ආදායම් බදු සමුළුව | චීනය | 05.03.2017-11.03.2017 |
| 32 | ආර්.පී.එස්. ලියනගේ මිය - නියෝජ්‍ය කොමසාරිස් | SME මත අවධානය යොමු කරමින් බදු අනුකූලතාවයන් කළමනාකරණය | චීනය | 09.04.2017-16.04.2017 |

| | | | | |
|---|---|---|---|---|
| 33 | එස්.ඩී. නිර්මලාදේවි මිය - නියෝජ්‍ය කොමසාරිස් | LHDNM-OECD වඩා යහපත් බදු පරිපාලනයක් සඳහා තාක්ෂණය සහ විශ්ලේෂණ විධි | මැලේසියාව | 09.04.2017-15.04.2017 |
| 34 | එස්.ඩබ්.පී.වයි. සිල්වා මහතා - නියෝජ්‍ය කොමසාරිස් | පශ්චාත් කළමනාකරණ වැඩසටහන් හි දෙවන රාජ්‍ය අධ්‍යයන චාරිකාව (MPM) | චීනය | 27.02.2017-11.03.2017 |
| 35 | එන්.එස්.පී. සේනානායක මහතා - නියෝජ්‍ය කොමසාරිස් | BEPS සඳහා විගණන MNES සිද්ධි අධ්‍යයන වැඩමුළුව | මෙක්සිකෝව | 25.11.2017-03.12.2017 |
| 36 | බී.එන්.එස්. පෙරේරා මහතා - නියෝජ්‍ය කොමසාරිස් | පොදු රාජ්‍ය මණ්ඩලයේ බදු පරිපාලකයින්ගේ පුහුණු වැඩසටහන | එක්සත් රාජධානිය | 28.07.2017-09.09.2017 |
| 37 | එච්.ඩී.ආර්.පී. සිරිවර්ධන මහතා - නියෝජ්‍ය කොමසාරිස් | පශ්චාත් රාජ්‍ය කළමනාකරණ වඩසටහනෙහි දෙවන රාජ්‍ය අධ්‍යනය චාරිකාව (MPM) - 2016 | චීනය | 27.02.2017-11.03.2017 |
| 38 | බී.ජී.එස්. තුෂාර මහතා - නියෝජ්‍ය කොමසාරිස් | අවදානම් තක්සේරුකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | ෆීජි | 23.04.2017-29.04.2017 |
| 39 | වයි.එස්. දිසානායක මහතා - නියෝජ්‍ය කොමසාරිස් | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අන්තර් ජාති ක VAT/GST වැඩමුළුව SARTTAC | ඉන්දියාව | 24.09.2017-30.09.2017 |
| 40 | ඩබ්.අයි.බාලරාජ් මහත්මිය - නියෝජ්‍ය කොමසාරිස් | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අන්තර් ජාතික VAT/GST වැඩමුළුව SARTTAC | ඉන්දියාව | 24.09.2017-30.09.2017 |
| 41 | එච්.එම්.ඒ.එල්.බී. හේරත් මහතා - නියෝජ්‍ය කොමසාරිස් | අවදානම් තක්සේරුකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | ෆීජි | 23.04.2017-29.04.2017 |
| 42 | එම්.ජී.ආර්.ඩබ්.බී. කඩුවෙල මහතා - නියෝජ්‍ය කොමසාරිස් | විමර්ශන හා බුද්ධමය එක් රැස් කිරීම සඳහා නවීන තාක්ෂණයන් පිළිබඳ දැණුම | ඉන්දියාව | 21.08.2017-25.08.2017 |
| 43 | එස්.කේ.එන්. සුජානි මහත්මිය - නියෝජ්‍ය කොමසාරිස් | පොදු රාජ්‍ය මණ්ඩලයේ බදු පරිපාලකයින්ගේ පුහුණු වැඩසටහන | එක්සත් රාජධානිය | 28.07.2017-10.09.2017 |
| 44 | එස්. සමරසිංහ මහතා - නියෝජ්‍ය කොමසාරිස් | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අන්තර් ජාතික VAT/GSTවැඩමුළුව SARTTAC | ඉන්දියාව | 24.09.2017-30.09.2017 |
| 45 | එච්.ටී.ජී.එල්.ආර්. අබේසේකර මහතා නියෝජ්‍ය කොමසාරිස් | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අන්තර් ජාතික VAT/GST වැඩමුළුව SARTTAC | ඉන්දියාව | 24.09.2017-30.09.2017 |

| | | | | |
|---|---|---|---|---|
| 46 | කේ.ඩබ්.කේ. නන්දසිරි මහතා - නියෝජ්‍ය කොමසාරිස් | බදුකරණ පිළිබඳ රාජ්‍ය පරිපාලන විසින් සංවිධානය කරන ලද බදු වැඩමුළුව | චීනය | 11.10.2017-31.10.2017 |
| 47 | කේ.එන්.එන්. කහවිදානගේ මහතා - නියෝජ්‍ය කොමසාරිස් | SME මත අවධානයයොමු කර මින් බදු අනුකූලතාවයන් කළමනාකරණය | චීනය | 09.04.2017-16.04.2017 |
| 48 | එච්.එස්.වයි. සොයිසා මහත්මිය - නියෝජ්‍ය කොමසාරිස් | කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | තායිලන්තය | 19.03.2017-26.03.2017 |
| 49 | කේ.ජ්.එස්. විජිත කුමාර මහතා - නියෝජ්‍ය කොමසාරිස් | බදුකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලනය විසින් සංවිධානය කරන ලද බදු වැඩමුළුව | චීනය | 11.10.2017-31.10.2017 |
| 50 | සී.ජේ. ගමගේ - මෙනවිය නියෝජ්‍ය කොමසාරිස් | බදුකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලනය විසින් සංවිධානය කරන ලද බදු වැඩමුළුව | චීනය | 11.10.2017-31.10.2017 |
| 51 | එච්.එම්. කොරේරා මෙනවිය - නියෝජ්‍ය කොමසාරිස් | කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | තායිලන්තය | 19.03.2017-26.03.2017 |
| 52 | බී.ඩී.එන්.පී. කුමාර මහතා - සහකාර කොමසාරිස් | බදුකරණය පිළිබඳ රාජ්‍ය පරිපාලනය විසින් සංවිධානය කරන ලද බදු වැඩමුළුව | චීනය | 11.10.2017-31.10.2017 |

**1.4.3. සාමාන්‍ය පරිපාටිය යටතේ ලබා දෙන ලද විදේශ පුහුණුවීම්**

i. වර්ෂය තුළදී නෙදර්ලන්තයේ පවත්වන ලද බදු පරිපාලනය පිළිබඳ වැඩමුළුවට දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් සංඛ්‍යාවක් සහභාගි විය.

ii. බදුකරණය හා සම්බන්ධ ව්‍යාපාර කළමණාකරණ පශ්චාත් උපාධිය සාර්ථකව සම්පූර්ණ කරන ලද නිලධාරීන් තායිලන්තයේ පැවති වැඩමුළුවට සහභාගි විය.

iii. සිංගප්පූරුවේ පැවති විද්‍යුත් පාලනය සහ තොරතුරු තාක්ෂණ පද්ධති කළමණාකරණය සම්බන්ධ වැඩමුළුවට දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන්, RAMIS කමිටුවේ නිලධාරීන් සහ පරිශීලක ප්‍රතිග්‍රාහක පරීක්ෂාවන්හි නිරත නිලධාරීන්ගෙන් සමන්විත 21 දෙනෙකුගේ කණ්ඩායමක් සහභාගි විය.

IRDSL

# කොටස II

# බදු පරිපාලනය

IRDSL

IRDSL

# පරිච්ඡේදය 2

# ආදායම් රැස්කිරීම

IRDSL

IRDSL

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය තුළ දී රු. 836,517,705,134/- ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත. (ඊට පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද යන රැස්කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත් වේ.) විවිධ බදු රැස්කිරීම් සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු සංඛ්‍යාවේ එකතුව 2017.12.31 දින වන විට 1,409,944 ක්ව පැවතිණි.

## 2.1 බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව

වසර අවසාන වන විට බදු ගෙවීම සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව අංක 2.1 වගුවෙහි දක්වා ඇත.

වගුව **2.1 - 2017.12.31** දිනට බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව.

| | | |
|---|---|---|
| **ආදායම් බද්ද** | | |
| **සංස්ථාපිත** | | |
| වාසික සමාගම් / නිර්වාසික සමාගම් | 49,000 | **49,000** |
| **සංස්ථාපිත නොවන** | | |
| තනි පුද්ගල | 133,871 | |
| හවුල් ව්‍යාපාර | 12,907 | |
| පුද්ගල මණ්ඩල ආදිය | 804 | |
| උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තියන් (2017.03.31) දිනට* | 1,051,364 | 1,198,946 |
| **ආදායම් බදු ගෙවන මුළු සංඛ්‍යාව** | | **1,247,946** |
| **අනෙකුත් බදු ගෙවන්නන්** | | |
| ආර්ථික සේවා ගාස්තුව සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සහ හවුල් ව්‍යාපාර | 11,159 | |
| එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 23,695 | |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 233 | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 96,468 | |
| මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 233 | |
| ඔට්ටු බදු ලිපිගොනු සංඛ්‍යාව | 605 | |
| සූදු බදු ලිපිගොනු සංඛ්‍යාව | 5 | |
| **මුළු අනෙකුත් බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **132,398** |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සේවා යෝජකයන් | 19,469 | |
| පොළිය මත රඳවා ගැනීමේ බදු (රඳවා ගැනීමේ නියෝජිතයන්) | 409 | |
| නිශ්චිත ගාස්තු යටතේ රඳවා ගනීමේ බදු (විධිමත් මාසික උපලේඛන සැපයුම්කරුවෝ) | 465 | |
| මුද්දර බදු (විධිමත් මාසික උපලේඛනගත සැපයුම්කරුවන්) | 9,257 | **29,600** |
| **2017.12.31 දිනට මුළු ලිපිගොනු / බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව** | | **1,409,944** |

## 2.2 මුළු ආදායම් රැස්කිරීම

වර්ෂය සඳහා මුළු ආදායම් රැස් කිරීම රුපියල් මිලියන 836,518 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 194,970 ක ඉහළ යාමක් පෙන්නුම් කරයි. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම ඇතුළුව බදු අනුකූලතාවය වර්ධනය සඳහා පහසුකම් සැලසීමට සහ බලාත්මක කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය විසින් ගන්නා ලද පුළුල් ක්‍රියාමාර්ග හේතු කොට ගෙන ප්‍රධාන වශයෙන් ම මෙම ජයග්‍රහණ සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

රජයේ ආදායමට වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ දායකත්වයෙහි ප්‍රතිශතය 45.67% කි. අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායමේ මුළු රැස්කිරීම, 99.84% ක අගයක් පෙන්වන අතර ශුද්ධ ආදායම (පළාත් සභාවලට සම්පූර්ණයෙන්ම මාරු කරන ලද මුද්දර ගාස්තු සහ පළාත් සභාවලට මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද යටතේ එකතුවෙන් 1/3 ක් හැර) වසර සඳහා ඇස්තමේන්තුවෙන් 94.57% ක් විය.

එකතු කරන ලද ආදායම් බදු මුළු ආදායම් ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2016 දී 37.16% ක් වූ අගය 2017 දී 27.48% දක්වා අඩු වී ඇති අතර නාමික වශයෙන් ගත් කළ පෙර වර්ෂයේ රුපියල් මිලියන 238,398 ට සාපේක්ෂව 2017 දී රුපියල් මිලියන 229,841 ක් වූ 7.03% ක අඩුවීමකි. වාර්ෂික ඇස්තමේන්තුවට සාපේක්ෂව මෙම වසර තුළ ආදායම් බදු එකතු කිරීමේ 11.06% ක හිඟයක් පෙන්නුම් කරයි. මෙම අඩුවීමට හේතුව පාඩු ලබන හෝ ආදායම් බද්දෙන් නිදහස් සෑම පුද්ගලයෙකුම ආර්ථික සේවා බද්දට යටත් කරමින් සිදු කරන ලද සංශෝධනය විය හැක.


එකතු කළ අගය මත බදු රැස් කිරීම පෙර වසරට සාපේක්ෂව 32.31% කින් සහ නාමික අගයෙන් රුපියල් මිලියන 160,287 කින් වැඩි විය. එසේ වැඩි වීම සඳහා හේතුව බද්දට යටත් පිරිවැටුමේ සීමාව අඩු කිරීම සහ එකතු කළ අගය මත බදු අනුපාතය 15% දක්වා වැඩි කිරීම විය හැකිය.

2016 සහ 2017 අයවැය යෝජනා මගින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය අනුව, ලාභ උපයන ව්‍යාපාර ආර්ථික සේවා ගාස්තු අය කිරීමෙන් බැහැර කිරීම ඉවත් කරන අතර අනුප්‍රමාණය වැඩි කිරීමට සහ බද්දට යටත් උපරිම සීමාව අඩු කිරීමට යෝජනා වූ අතර ආර්ථික සේවා ගාස්තු රැස් කිරීම පෙර වසරට සාපේක්ෂව සීඝ්‍ර ලෙස වැඩි වීමක් පෙන්වයි.

අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ග යටතේ ආදායම සැසඳීමක් 2.2 වන වගුවෙහි දක්වා ඇති අතර, එය 01 වන ප්‍රස්ථාරය මගින් නිරූපණය කෙරේ. වසර තුළ මුදල් ප්‍රවාහය 2.3 වන වගුවෙහි දක්වා ඇති අතර එය 02 වන ප්‍රස්ථාරය මගින් නිරූපණය කෙරේ.


**වගුව 2.2 - මුළු ආදායම රැස්කිරීම - 2017**

| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව රු. (සංශෝධිත) | ආදායම් රැස් කිරීම රු. | රැස් කිරීම් ඇස්තමේන්තුවේ % ක් ලෙස | රැස් කිරීම් මුළු ආදායමේ % ක් ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 260,000,000,000 | 229,841,806,636 | 88.40% | 27.48% |
| ආර්ථික සේවා ගාස්තුව | 48,000,000,000 | 44,719,757,960 | 93.17% | 5.35% |
| ඔට්ටු හා සූදු බද්ද | 1,800,000,000 | 1,929,034,608 | 107.17% | 0.23% |
| කොටස් ගනුදෙනු බද්ද | 1500,000,000 | 1,333,904,584 | 88.93% | 0.16% |
| එකතු කළ අගය මත බද්ද | 450,000,000,000 | 443,739,474,789 | 98.61% | 53.05% |
| භාණ්ඩ හා සේවා බද්ද | - | 115,977 | - | 0.00% |
| පිරිවැටුම් බද්ද | - | 20,753,568 | - | 0.00% |
| ජාතික ආරක්ෂක බද්ද | - | 15,947,317 | - | 0.00% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 45,000,000 | 52,769,318 | 117.27% | 0.01% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 75,000,000,000 | 101,824,565,352 | 135.77% | 12.17% |
| මුද්දර බද්ද | - | 11,377,134,752 | - | 1.36% |
| ඉඩම් බද්ද | | 7,382,158 | | 0.00% |
| වාහන හිමිකම් බද්ද | 1,500,000,000 | 1,650,961,000 | 110.06% | 0.20% |
| විගමන බද්ද | 10,000,000 | 4,097,115 | 40.97% | 0.00% |
| මුළු ආදායම් රැස්කිරීම | **837,855,000,000** | **836,517,705,134** | **99.84%** | **100.00%** |




## 2.3 මුළු ආදායම් ප්‍රවාහය


| වගුව 2-3 - මුළු ආදායම් ප්‍රවාහය - 2017 | | |
|---|---|---|
| මාසය | ආදායම් රැස් කිරීම් (ස.ආ.බ. ඇතුළුව) රු. | සමුච්චිත ආදායම් රැස් කිරීම් (රු.) |
| ජනවාරි | 79,756,429,537.27 | 79,756,429,537.27 |
| පෙබරවාරි | 63,916,411,803.24 | 143,672,841,340.51 |
| මාර්තු | 62,413,455,936.54 | 206,086,297,277.05 |
| අප්‍රේල් | 71,908,338,157.40 | 277,994,635,434.45 |
| මැයි | 71,129,846,329.36 | 349,124,481,763.81 |
| ජූනි | 52,025,081,056.46 | 401,149,562,820.27 |
| ජූලි | 68,866,903,035.39 | 470,016,465,855.66 |
| අගෝස්තු | 72,842,785,905.04 | 542,859,251,760.70 |
| සැප්තැම්බර් | 74,035,803,021.06 | 616,895,054,781.76 |
| ඔක්තෝබර් | 70,134,959,443.65 | 687,030,014,225.41 |
| නොවැම්බර් | 78,948,715,454.80 | 765,978,729,680.21 |
| දෙසැම්බර් | 67,267,533,845.07 | **833,246,263,525.28** |




## 2.4 පෙර වසර සමඟ ආදායම සැසඳීම

| වගුව 2.4 - පෙර වසර සමග ආදායම සැසඳීම | | | |
|---|---|---|---|
| බදු වර්ගය | **2017** ආදායම් රැස් කිරීම් රු. | **2016** ආදායම් රැස් කිරීම් රු. | රැස් කිරීමේ අඩුවීම හෝ වැඩිවීම (%) ප්‍රතිශතයක් ලෙස |
| ආදායම් බදු | 229,841,806,636 | 238,398,610,641 | -3.59% |
| ආර්ථික සේවා ගාස්තු | 44,719, 757,960 | 20,458,175,363 | 118.59% |
| ඔට්ටු හා සූදු බද්ද | 1,929,034,608 | 1,884,498,652 | 2.36% |
| කොටස් ගනුදෙනු බද්ද | 1,333,904,584 | 737,659,559 | 80.83% |
| එකතු කළ අගය මත බද්ද | 443,739,474,789 | 283,451,513,780 | 56.55% |
| භාණ්ඩ හා සේවා බද්ද | 115,977 | 1,585,883 | -92.69% |
| පිරිවැටුම් බද්ද | 20,753,568 | 16,639,038 | 24.73% |
| ජාතික ආරක්ෂක බද්ද | 15,947,317 | 8,091,202 | 97.09% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 52,769,318 | 258,801,839 | -79.61% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 101,824,565,352 | 84,066,526,724 | 21.12% |
| මුද්දර බද්ද | 11,377,134,752 | 10,650,973,620 | 6.82% |
| ඉඩම් බද්ද | 7,382,158 | 22,665,680 | -67.43% |
| වාහන හිමිකම් බද්ද | 1,650,961,000 | 1,579,133,507 | 4.55% |
| විගමන බද්ද | 4,097,115 | 11,054,550 | -62.94% |
| සමාජ වගකීම් බද්ද | | 836,043 | -100.00% |
| **මුළු ආදායම් එකතුව** | **836,517,705,134** | **641,546,766,081** | **30.39%** |

**සටහන 03**
**පෙර වසර සමඟ ආදායම සැසඳීම**




## 2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩ නැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම

2011 අයවැය යෝජනාවලට අනුකූලව පනවා ඇති අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට කරන ලද සංශෝධන ප්‍රකාර, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් රැස් කරනු ලබන පහත සඳහන් බදු දක්වා ඇති ප්‍රතිශතයන්ගෙන් පළාත් සභා වලට මාරුකරන ලදි.

**ජාතිය ගොඩනැගීමේ බදු - මුළු එකතුවෙන් 33.33%**

**මුද්දර ගාස්තුව - මුළු එකතුවෙන් 100.00%**

දෙපාර්තමේන්තුව විසින් අදාළ බදුවල මුළු රැස් කිරීම් ප්‍රමාණය සහ පළාත් සභාවලට මාරු කරන ලද මුදල 2.5 වන වගුවෙහි දැක්වේ.

**වගුව 2.5 - පළාත් සභාවල බදු ආදායම් රැස් කිරීම් - 2017**

| | මුළු එකතුව රු. | පළාත් සභාවලට මාරු කළ ප්‍රමාණය රු. | % |
|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 101,824,565,352 | 32,789,366,798 | 33.33% |
| මුද්දර බද්ද | 11,377,134,752 | 11,377,134,752 | 100.00% |

## 2.6 ආදායම් රැස් කිරීම් - ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් පදනම්

වසර තුළ රැස් කරන ලද සමස්ත ආදායමෙන් (ආනයන මත එකතු කළ අගය මත බදු හා ආනයන මත ජාතිය ගොඩනැගීමේ බදු හැර) ස්ව තක්සේරු පදනම යටතේ ගෙවීම් සමස්ත වටිනාකමට සම්පූර්ණයෙන්ම වාගේ දායකත්වය ලබා දුනි. තව ද, නිලතක්සේරු ආකාරයෙන් ආදායම් රැස් කිරීම මුළු එකතුවෙන් 4% ක් පමණක් විය. වසර තුළ ක්‍රියාත්මක කරන ලද විගණන කාර්යයන් තුළින් පෙර වසර සමඟ සසඳා බලන කළ තක්සේරු තුළින් රැස් කිරීම් හි අඩු වීමක් පිළිබිඹු කරයි. කෙසේ වෙතත්, ස්ව තක්සේරු පදනම යටතේ ආදායම් රැස්කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මෙහෙවරෙහි මූලික කොටසක් ලෙස ස්වේච්ඡා අනුකූලතාවය දිරි ගැන්වීම පිණිස ප්‍රයත්නයන් දරන ලදි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලද අතර මෙහි සාර්ථකත්වය සඳහා අවශ්‍ය පහසුකම් අඛණ්ඩව සලසන ලදි. මේ පිළිබඳ සංසන්දනාත්මක අගයයන් 2.6 වැනි වගුවෙහි දක්වා ඇත.


| වගුව 2.6 - ස්ව තක්සේරු සහ වෙනත් පදනම් මත රැස්කිරීම් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2015 ( රු.'000 ) | | 2016 ( රු.'000 ) | | 2017 ( රු.'000 ) | |
| | ස්වයං තක්සේරු | වෙනත් | ස්වයං තක්සේරු | වෙනත් | ස්වයං තක්සේරු | වෙනත් |
| ආදායම් බද්ද | 256,434,940 | 11,539,082 | 220,471,725 | 17,926,886 | 217,555,269 | 12,286,538 |
| එකතු කළ අගය මත බද්ද (ආනයන මත එ.අ.බ. හැර) | 130,510,553 | 4,688,017 | 161,404,285 | 6,710,993 | 269,545,383 | 5,801,17 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (ආනයන මත ජා.ගො.බ. හැර) | 41,419,548 | 1,445,941 | 53,290,159 | 2,313,174 | 69,034,384 | 4,009,688 |
| වෙනත් | 113,907,066 | 477,215 | 34,757,043 | 873,072 | 60,358,388 | 753,469 |
| **එකතුව** | **542,272,107** | **18,150,250** | **496,923,212** | **27,824,125** | **616,493,424** | **22,850,832** |
| සමස්ත ආදායමට % (ආනයන මත එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද හැර) | 97% | 3% | 94% | 6% | 96% | 4% |

## 2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය

2017 වසරේ රජයේ ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙන්ම පසුගිය වසර හතරක කාලය තුළ එහි ප්‍රවණතාවයන් 2.7 වන වගුවෙන් පෙන්වන අතර, එම දායකත්වය 04 වන සටහනින් නිරූපණය කෙරේ. 2017 වසරේ රජයේ ආදායම රුපියල් මිලියන 1,831,531 (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව - 2017) දක්වා වැඩි වී ඇත්තේ මුළු රාජ්‍ය ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීම්වල දායකත්වය 45.67% ක් ලෙස වාර්තා කරමිනි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අඛණ්ඩව පහළ ගොස් ඇති අතර, එය 2017 වසරේ දී 6.29% ක් ලෙස සුළු ඉහළ යාමක් පෙන්නුම් කරයි.

| වගුව 2.7 - ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් රැස් කිරීම (රු. මිලියන) | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීමේ ප්‍රතිශතය | ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ දළ ජාතික නිෂ්පාදන (රු. මිලියන) | දළ ජාතික නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය |
| 2013 | 1,137,447 | 492,539 | 43.30% | 8,674,230 | 5.68% |
| 2014 | 1,195,206 | 514,161 | 43.02% | 9,784,672 | 5.25% |
| 2015 | 1,454,878 | 560,422 | 38.52% | 11,183,220 | 5.01% |
| 2016 | 1,686,061 | 641,547 | 38.05% | 11,838,975 | 5.42% |
| 2017 | 1,831,531 | 836,518 | 45.67% | 13,289,466 | 6.29% |
| මූලාශ්‍රය: *මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය (වාර්ෂික වාර්තාව) **ශ්‍රී ලංකා මහ බැංකුව (වාර්ෂික වාර්තාව) | | | | | |




## 2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය

ආදායම් වාර්තා නිසි වේලාවට සැපයීම මගින් සහ ස්වතක්සේරු මත පදනම්ව බදු ගෙවීම සඳහා බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය වැඩිදි යුණු කිරීමේ වැඩ සටහන් වර්ෂය පුරා අඛණ්ඩව ක්‍රියාත්මකව පැවතිණි.

ඒ අනුව, 2016/2017 තක්සේරු වර්ෂය තුළ දී නියමිත දින සංස්ථාපිත නොවන අංශයේ ආදායම් බදු වාර්තා කිරීමේ ප්‍රතිශතය 45% ක් වූ අතර නියමිත දිනයෙන් එක් මාසයක් තුළ එය 56% දක්වා ඉහළ ගොස් ඇත. නියමිත දිනෙන් මාස දෙකක් තුළ සංස්ථාපිත අංශයෙහි අනුකූලතා අනුප්‍රමාණය 64% ක් විය.

සංස්ථාපිත අංශය සම්බන්ධයෙන්, එය නියමිත දිනට 41% ක් වූ අතර, නියමිත දිනෙන් එක් මාසයක් තුළ එය 45% ක් විය. නියමිත දිනෙන් මාස දෙකක් තුළ මෙම අංශයෙහි අනුකූලතා අනුප්‍රමාණය 47% ක් විය.

සියලු බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය ස්වතක්සේරු බදු ක්‍රමයක අපේක්ෂිත මට්ටමේ නොවුන ද, බොහෝ දුරට අනුකුල වී ඇත. කෙසේ වෙතත්, වාර්තා අනුකූලතාවය සාක්ෂාත් කර ගැනීමෙහි ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අවශ්‍ය ක්‍රියාමාර්ග අඛණ්ඩව ගනු ලබයි.

කෙසේ වෙතත්, සැලකිල්ලට බඳුන් කරන වසරේ දී ජාතිය ගොඩනැගීමේ බද්දෙහි සැලකිය යුතු අඩුවීමක් දැක ගත හැකිය. e - අයදුම් පද්ධති වාර්තා ඉදිරිපත් කිරීමේ දී එම බදු ගෙවන්නන්ට අවශ්‍ය සහාය ලබා දුන්න ද ඒ පිළිබඳව මනා අවබෝධයක් නොමැති වීම මෙම අඩුවීමට හේතු වූවා විය හැකිය.

2.8.1 වන වගුවෙන් 2012/2013 සිට 2016/2017 වසර දක්වා නියමිත දිනට සහ නියමිත දින සිට එක් මසක් තුළ ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය පෙන්වයි. අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතා අනුප්‍රමාණයන් 2.8.2 වන වගුවෙන් පෙන්වයි.

| වගුව **2.8.1 -** ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතාවය **2012/2013** සිට **2016/2017** දක්වා | | | |
|---|---|---|---|
| තක්සේරු වර්ෂය | අංශය | නියමිත දිනට අනුකූලතාවය | නියමිත දින සිට මාසයක් තුළ අනුකූලතාවය |
| 2012/2013 | සංස්ථාපිත | 56% | 70% |
| | සංස්ථාපිත නොවන | 41% | 54% |
| 2013/2014 | සංස්ථාපිත | 53% | 61% |
| | සංස්ථාපිත නොවන | 42% | 57% |
| 2014/2015 | සංස්ථාපිත | 52% | 58% |
| | සංස්ථාපිත නොවන | 47% | 62% |
| 2015/2016 | සංස්ථාපිත | 30% | 46% |
| | සංස්ථාපිත නොවන | 48% | 59% |
| 2016/2017 | සංස්ථාපිත | 41% | 45% |
| | සංස්ථාපිත නොවන | 45% | 56% |

| වගුව **2.8.2 -** අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතාවය | | | | |
|---|---|---|---|---|
| | එකතු කළ අගය මත බදු | ජාතිය ගොඩනැගීමේ බදු | උපයන විට ගෙවීමේ බදු | |
| වසර 2015 | 65% | 86% | තක්සේරු වර්ෂ 2014/15 | 63% |
| වසර 2016 | 71% | 31% | තක්සේරු වර්ෂ 2015/16 | 57% |
| වසර 2017 | 47% | 21% | තක්සේරු වර්ෂ 2016/17 | 14% |

## 2.9 ආදායම් බදු රැස් කිරීම

සංස්ථාපිත ආදායම් බද්ද, පුද්ගල ආදායම් බද්ද, ලාභාංශ බදු සහ රඳවාගැනීමේ බදු හරහා 2016 දී එකතු කරගත් බදු ආදායම වන රුපියල් මිලියන 238,398 ට සාපේක්ෂව 2017 වසරේ දී 3.72% කින් අඩුවී ඇති අතර එය රු. 229,842 ක් වේ. වසර තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුළු ආදායමෙන් සමස්ත ආදායයම් බදු එක්රැස් කිරීම 27.48% ක් වන අතර, එය 2016 වසරේ දී 37.16% ක් විය.

### 2.9.1 ආදායම් බදු රැස් කිරීම - ආංශීය වශයෙන් පැහැදිලි කිරීම

මුළු ආදායම් බදු රැස්කිරීම සඳහා සංස්ථාපිත අංශයෙන් ලද දායකත්වය රුපියල් මිලියන 144,134 ක් හෙවත් එකතු කරන ලද මුළු බදු ප්‍රමාණයෙන් 60% ක් විය. සංස්ථාපිත නොවන අංශයේ දායකත්වය රුපියල් මිලියන 94,265 ක් හෙවත් 40% කි.


අංක 2.9.1 වන වගුව මගින් එහි සංයුතිය පෙන්වන අතර අංක 05 වන සටහනෙන් එය නිරූපණය කෙරේ.

| වගුව **2.9.1 -** සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස්කිරීම් **2016** සහ **2017** | | | | |
|---|---|---|---|---|
| | **2017** | | **2016** | |
| | බදු රැස් කිරීම (රු.) | % | බදු රැස් කිරීම (රු.) | % |
| සංස්ථාපිත* | 132,871,563,934 | 58% | 144,133,758,898 | 60% |
| සංස්ථාපිත නොවන** | 96,970,242,702 | 42% | 94,264,851,743 | 40% |
| **එකතුව** | **229,841,806,636** | **100%** | **238,398,610,641** | **100%** |

* 2016 වසරේ රුපියල් මිලියන 15,902ක සහ 2017 වසරේ රුපියල් මිලියන 17,074 ක ලාභාංශ බදු ඇතුළත්ය.

** පොළී ආදායමෙන් සංස්ථාපිත අංශය විසින් ඉටු කරන ලද සේවාවන්ගෙන් අඩු කරන ලදුව, ප්‍රේෂණය කරන ලද රඳවා ගැනීමේ බදු සහ උපයන විට ගෙවීමේ (PAYE) ක්‍රමය යටතේ සේවා නියුක්තීන් විසින් ගෙවන ලද ආදායම් බදු ඇතුළත් ය.

සටහන 05
සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස්කිරීම් 2016 සහ 2017




## 2.9.2 ආදායම් බදු රැස්කිරීමේ ප්‍රභවමය වශයෙන් විශ්ලේෂණය

වසර තුළ රැස් කරන ලද ආදායම් බදුවල ප්‍රභවමය වශයෙන් සංයුතිය (සේවා නියුක්ත සහ වෙනත්) අංක 2.9.2 දරන වගුවෙන් පෙන්නුම් කෙරේ.

| වගුව 2.9.2 - ආදායම් බදු රැස්කිරීම - 2017 | | |
|---|---|---|
| ප්‍රභවය | බදු රැස් කිරීම (රු. මිලියන) | |
| **සේවා නියුක්තිය** | | |
| උ.වි.ගෙ. ක්‍රමය | 32,466.24 | |
| පැහැර හරින ලද බදු සමඟ දණ්ඩන තක්සේරු කිරීම | 454.02 | **32,920.26** |
| **වෙනත්** | | |
| ස්වයං තක්සේරු සහ දණ්ඩන සමඟ තක්සේරු කිරීම් | 116,374.25 | |
| පොළී මත රඳවා ගැනීමේ බදු, කුලී සහ නියමිත ගාස්තු | 55,333.81 | |
| ප්‍රභවයේ දී වෙනත් අඩු කිරීම් | 25,258.12 | |
| **දළ බදු රැස් කිරිම** | | **229,886.44** |
| අඩු කළා: ආපසු ගෙවීම් | | (44.63) |
| **ශුද්ධ රැස් කිරීම්** | | **229,841.81** |

රඳවා ගැනීමේ බදු යාන්ත්‍රණය යටතට නොගැනෙන වෙළෙඳාම, ව්‍යාපාර, වෘත්තීය, රැකියාව සහ වෙනත් සේවා මත බදු ඇතුළුව ස්වතක්සේරු හා දණ්ඩන සමඟ තක්සේරු ආකාරයෙන් රැස් කිරීම් එකතුව රුපියල් මිලියන 116,374 ක් වේ.

## 2.10 එකතු කළ අගය මත බදු රැස් කිරීම.


අදාළ වර්ෂය තුළ දී එකතු කළ අගය මත බදු එකතු කිරීම පෙර වර්ෂයේ රුපියල් මිලියන 283,451 ට වඩා 32.31% ක එනම් රුපියල් මිලියන 160,287 කි. කෙසේ වුව ද වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත ප්‍රමාණය වන රුපියල් මිලියන 450,000 ට සාපේක්ෂව මෙම වසරේ ආදායම රුපියල් මිලියන 6,250 ක අඩුවීමක් පෙන්නුම් කරයි. ලියාපදිංචිය සඳහා යටත් සීමාව අඩු කිරීම, එකතු කළ අගය මත බදු අනුපාතය වැඩි කිරීම, ඇතැම් නිදහස් කිරීම් ඉවත් කිරීම සහ RAMIS යටතේ පරිපාලනයේ වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම එකතු කළ අගය මත බදු ආදායම වැඩිවීමට මහෝපකාරී විය. දේශීය සැපයුම් සහ

ආනයන මත එකතු කළ අගය මත බදු එකතු කිරීම පෙර වසරට සාපේක්ෂව සීඝ්‍ර වැඩිවීමක් පෙන්නුම් කරයි. වසර සඳහා දේශීයව එකතුකළ අගය මත බදු වටිනාකම රුපියල් මිලියන 275,346 ක් වන අතර එය 2016 වසරේ එකතු කරගත් රුපියල් මිලියන 168,115 ට සාපේක්ෂව 63.78% ක වැඩිවීමකි. 2017 වසර තුළ ආනයනය මත එකතු කර ගත් එකතු කළ අගය මත බදු ආදායම පෙර වසරට සාපෙක්ෂව 46% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

එකතු කළ අගය මත ආංශික වශයෙන් දළ රැස්කිරීම, ආපසු ගෙවීම සහ ශුද්ධ රැස් කිරීම 2.10.1 වන වගුවෙන් පෙන්වන අතර, එය 06 වන සටහනෙන් නිරූපණය කෙරේ.

**වගුව 2.10.1 - එකතු කළ අගය මත බදු දළ රැස් කිරීම් සහ ආපසු ගෙවීම්**

| අංශය | 2016 ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | | 2017 දළ රැස් කිරීම් (රු. මිලියන) | | 2017 ආපසු ගෙවීම් | 2017 ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | |
|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන අංශය | | 35,412.91 | | 76,523.50 | 677.19 | | 75,846.31 |
| නිෂ්පාදන නොවන අංශය | | | | | | | |
| - සේවාව | 96,605.62 | | 149,447.29 | | 0.03 | 149,447.2 6 | |
| - මූල්‍ය සේවාව | 36,096.75 | 132,702.37 | 50,052.95 | 199,500.24 | | 50,052.95 | 199,500.21 |
| එකතුව දේශීය | | 168,115.28 | | 276.023.74 | | | 275,346.52 |
| ආනයන | | 115,336.23 | | 168,394.62 | 1.67 | | 168,392.95 |
| මුළු එකතුව | | **283,451.51** | | **444,418.36** | **678.89** | | **443,739.47** |



**සටහන 06**
**එකතු කළ අගය මත බදු රැස්කිරීම – 2017**

**වගුව 2.10.2 දළ ජාතික නිෂ්පාදනයට එකතු කළ අගය මත බදු දායකත්වය ආංශීය වශයෙන් විශ්ලේෂණය**

| අංශය | 2016 ශුද්ධ රැස්කිරීම් රු. | 2016 % | 2017 ශුද්ධ රැස්කිරීම් රු. | 2017 % | දළ ජාතික නිෂ්පාදනයට ප්‍රතිශතය 2016 | දළ ජාතික නිෂ්පාදනයට ප්‍රතිශතය 2017 |
|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන අංශය | 35,412,908,090 | 12.49% | 75,846,312,316 | 17.09% | 0.29% | 0.57% |
| නිෂ්පාදන නොවන අංශය | 132,702,369,902 | 46.82% | 199,500,207,439 | 44.96% | 1.12% | 1.50% |
| එකතුව දේශීය | 168115277992 | 59.31% | 275346519755 | 62.05% | .141% | 2.07% |
| ආනයන මත | 115,336,235,788 | 40.69% | 168,392,955,034 | 37.95% | 0.97% | 1.26% |
| එකතුව | **283,451,513,780** | **100.00%** | **443,739,474,789** | **100.00%** | **2.39%** | **3.34%** |

| වගුව 2.10.3 දළ දේශීය එ.අ.බ - නිෂ්පාදන සහ සේවා අංශ | | | | | |
|---|---|---|---|---|---|
| අංශය | 2015 (රු.මි.) | 2016 (රු.මි.) | පසුගිය වසරට සාපේක්ෂව අඩුවීමේ/වැඩිවීමේ ප්‍රතිශතය (%) | 2017 (රු.මි.) | පෙර වසර හා සසඳා බලන විට අඩු හෝ වැඩිවීමේ ප්‍රතිශතය |
| බැංකු කටයුතු | 23,089 | 27,770 | 20.27% | 37,150 | 33.78% |
| රක්ෂණ | 5,403 | 6,371 | 17.92% | 7,313 | 14.79% |
| හෝටල් සහ ආපනශාලා | 7,429 | 10,566 | 42.23% | 13,668 | 29.36% |
| ඉදි කිරීම් | 6,605 | 8,230 | 24.60% | 14,542 | 76.70% |
| විදුලිබලය සහ ගෑස් | 501 | 526 | 4.99% | 674 | 28.14% |
| ආනයනය | 9,880 | 9,383 | -5.03% | 10,143 | 8.10% |
| මූල්‍ය | 18,487 | 20,242 | 9.49% | 21,121 | 4.34% |
| සංනිවේදනය | 376 | 7,429 | 1875.80% | 19,743 | 165.76% |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 417 | 175 | -58.03% | 0 | -100.00% |
| බීම - මද්‍යසාර | 396 | 1,553 | 292.17% | 18,802 | 1110.69% |
| වර්ගීකරණය නොකළ සේවා | 12,295 | 39,690 | 222.81% | 82,024 | 106.66% |
| වර්ගීකරණය නොකළ නිෂ්පාදන | 9,173 | 29,079 | 217.01% | 56,641 | 94.78% |
| අනෙකුත් | 36,460 | 36,091 | -1.01% | 50,053 | 38.69% |
| **එකතුව** | **130,511** | **197,105** | **51.03%** | **331,874** | **68.37%** |


## 2.11 ජාතිය ගොඩ නැගීමේ බදු රැස්කිරීම්

අදාළ වර්ෂය තුළ මුළු ආදායමට ජාතිය ගොඩනැගීමේ බදු දායකත්වය රු. මිලියන 101,824 ක් විය. මෙය කලින් වර්ෂයේ රැස්කරන ලද ප්‍රමාණයට වඩා 21.12% කි. මුළු ජාතිය ගොඩනැගීමේ බදු ආදායමෙන් රුපියල් මිලියන 32,789 ක් පළාත් සභා වෙත මාරු කරන ලදි.

| වගුව 2.11.1 - ආංශික වශයෙන් ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම් | | |
|---|---|---|
| අංශය | ශුද්ධ රැස් කිරීම් (රු.) | |
| | 2016 | 2017 |
| නිෂ්පාදන | 9,908,497,868 | 10,894,310,333 |
| සේවා | 29,120,398,350 | 38,821,335,524 |
| ආනයන | 18,395,242,141 | 19,319,552,697 |
| **එකතුව** | **57,424,138,359** | **69,035,198,554** |

2.11.2 වන වගුව මගින් පළාත් සභා වෙත මාරු කිරීමෙන් පසුව, පිළිවෙලින් 2016 වසරේ සහ 2017 වසරේ ජාතිය ගොඩ නැගීමේ ආදායම් ඇස්තමේන්තුව රැස් කරන ලද ආදායම සමඟ සැසඳීම දක්වා ඇත.

| වගුව 2.11.2 - ඇස්තමේන්තු සමඟ ජාතිය ගොඩනැගීමේ බදු රැස් කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තු ගත ආදායම රු. | ආදායම් රැස් කිරීම රු. | % |
| 2017 | 75,000,000,000 | 69,035,198,554 | 92% |
| 2016 | 54,000,000,000 | 57,424,138,359 | 106% |




2.11.1 **ජාතිය ගොඩ නැගීමේ බද්දට අදාළව සිදු කරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්:**

i. 2017 අගෝස්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් නිදහස් කිරීම් ඉවත් කර බද්දට යටත් කරන ලදී.

- ජාත්‍යන්තර ප්‍රවාහනයේ දී සේවා සැපයීමේ කර්තව්‍යයට අවශ්‍ය ඕනෑම භාණ්ඩයක් සැපයීම, ශ්‍රී ලංකා එයාර් ලයින් සමාගම, මිහින් ලංකා (පෞද්ගලික) සමාගම හෝ එයාර් ලංකා කේටරින් සර්විසර්ස් සමාගමට ලබා දෙනු ලබන භාණ්ඩ;
- ඕනෑම සමුපකාර සමාජයක් හෝ ලක් සතොස විසින් සපයනු ලබන ඕනෑම භාණ්ඩ හෝ සේවාවක්;
- උප කොන්ත්‍රාත්කරුවෙකු විසින් හැර කොන්ත්‍රාත්කරුවෙකු විසින් සපයන ඉදිකිරීම් සේවා;
- මෙරට තුළ සිදුකෙරෙන සංචාර සම්බන්ධව සංචාරක නියෝජිතයෙකු විසින් සපයන සේවාවන් (බැංකුවක් හරහා විදේශ මුදල් ඒකකයකින් ලැබෙන ගෙවීම්වලට අදාළ සේවාවන් හැර);
- නේවාසික මහල් නිවාස සැපයීම

ii. 2017 අගෝස්තු 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් නිදහස් කර ඇත.

-බාහිර ද්වාර ක්‍රියා කරුවන් විසින් දේශීය ක්‍රියා කරුවන් වෙත සපයන ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා.

-පුවත්පත් හැර මුද්‍රිත පොත්, සඟරා, ජර්නල් හෝ වාර සංග්‍රහයයන් සැපයීම.


iii. 2017 අගෝස්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් සේවාවන් නිදහස් කර ඇත.

ලංකා විදුලි බල මණ්ඩලය විසින් සපයන විදුලි බලය හැර විදුලි බල සැපයීම්

2.12 **ආර්ථික සේවා ගාස්තුව රැස් කිරීම**

අදාළ වර්ෂය තුළ සමස්ත ආර්ථික සේවා ගාස්තු රුපියල් මිලියන 44,719 ක් වූ අතර එමඟින් සමස්ත ආදායමට වූ දායකත්වය 5.35% කි. එය වසර සඳහා ඇස්තමේන්තුවෙන් සියයට 93 කි.

| වගුව 2.12 ආර්ථික සේවා ගාස්තුව රැස් කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම රු. | ආදායම් රැස් කිරීම රු. | % |
| 2017 | 48,000,000,000 | 44,719,757,960 | 93% |
| 2016 | 21,000,000,000 | 20,458,175,363 | 97% |




### 2.12.1. ආර්ථික සේවා ගාස්තුව සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

ආර්ථික සේවා ගාස්තුව සඳහා පහත සඳහන් වෙනස්කම් අය වැය මගින් යෝජනා කරන ලදි.

(i) 2017.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්තුවකට යටත් සීමාව රුපියල් මිලියන 50 සිට 12.5 දක්වා අඩු කරන ලදි.

(ii) 2017.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සෑම ආනයනික මෝටර් රථ සඳහා ආනයනකරුවෙකුට (ආර්ථික සේවා ගාස්තු බදු බැඳියාව සඳහා යටත් සීමාව නොසලකා හරිමින්) රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් සහතික කර ඇති වටිනාකම්, රක්ෂණය, ගැල්කුලී (CIF) වටිනාකම මත අත්තිකාරමක්, ආර්ථික සේවා ගාස්තු අත්තිකාරමක් ලෙස අය කරනු ලැබේ. එකම තක්සේරු වර්ෂයේ ආර්ථික ගාස්තු බැඳියාවට එදිරිව එම වසරේම ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු අත්තිකාරමක් කපා හැරිය හැකි නමුදු ආපසු ගෙවීමේ හිමිකමට යටත් නොවේ.

(iii) 2017.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආර්ථික සේවා බදු බැඳියාවන් සඳහා ශ්‍රී ලංකා මහා බැංකුව ද පුද්ගලයෙකු ලෙස නිර්වචනය කරමින් "පුද්ගලයා" යන්න නැවත නිර්වචනය කරන ලදී.

## 2.13 උපයන විට ගෙවීමේ බදු රැස් කිරීම

සේවා නියුක්ති ආදායම මත ආදායම් බද්දේ කොටසක් වන උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ වසර තුළ රැස්කරන ලද දළ ආදායම රුපියල් මිලියන 32,920 ක් විය.

### 2.14 රඳවා ගැනීමේ බදු (පොළිය සහ නිශ්චිත ගාස්තු මත) රැස් කිරීම


පොළිය මත රඳවා ගැනීමේ බදු රැස් කිරීම වසර තුළ රුපියල් 51,350,859,423 ක් විය. පොළිය මත රඳවාගැනීමේ බදු මගින් උපයා ගන්නා ලද ආදායම පෙර වසරට වඩා රුපියල් මිලියන 3,511 කින් වැඩි වීමක් පෙන්වයි.

### 2.15 ඔට්ටු සහ සූදු බදු රැස් කිරීම

වසර තුළ ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම රුපියල් මිලියන 1,929 ක් වූ අතර, එය කලින් වසර හා සසඳා බලන කළ 2.31% ක ඉහළයාමක් පිළිඹිබු කරයි. එසේම අදාළ වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත මුදලට වඩා රුපියල් මිලියන 129 ක අතිරික්තයක් විය.

වගුව **2- 13 -** ඔට්ටු හා සූදු බදු රැස් කිරීම්

| වර්ෂය | ඇස්තමේන්තු ගත ආදායම (රු.) | ආදායම රැස් කිරිම (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 2017 | 1,800,000,000 | 1,929,034,608 | 107% |
| 2016 | 900,000,000 | 1,884,498,652 | 209% |




### 2.16 වාහන හිමිකම් බද්ද

2015 අංක 10 දරන මුදල් පනත යටතේ පනවන ලද බලපත්‍රවල නිදහස් මෝටර් වාහන ආනයනය කිරීම වෙනුවට වාහන හිමිකම් ගාස්තුව 2016 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි හඳුන්වා දෙන ලදි.

මොටර් වාහනයක් ආනයනය කරනු ලබන සෑම තැනැත්තෙකු විසින් ම ණයවර ලිපියක් විවෘත කරන අවස්ථාවේ දී මෙම ගාස්තුව ගෙවිය යුතුය.

අදාළ වර්ෂය තුළ දී, රථවාහන හිමිකම් ගාස්තු වෙන් ආදායම රැස් කිරීම රු. මිලියනන 1,651 ක් වූ අතර එය වසර සඳහා කරන ලද ඇස්තමේන්තුවට වඩා රු. මිලියන 151 ක අතිරික්තයක් විය.

## 2.17 මුද්දර බදු රැස්කිරීම

මුද්දර බදු ලෙස රුපියල් මිලියන 10,651 ක් වර්ෂය තුළ දී උත්පාදනය විය. 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර බදු මාරුකිරීම) පනත ප්‍රකාර, මුද්දර බදු රැස් කිරීම් සම්පූර්ණ ප්‍රමාණය අදාළ පළාත් සභාවලට මාරු කරන ලදි. මුද්දර බදු පදනම ඉහළ නැංවීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් උපදේශන හා අධීක්ෂණ හමු පවත්වන ලදී.


## 2.18 දේශීය ආදායම් රැස්කිරීම - 2013 සිට 2017 දක්වා (බදු වශයෙන්)

වගුව **2.14 - දේශීය ආදායම් රැස්කිරීම 2013 සිට 2017 දක්වා බදු වශයෙන් විශ්ලේෂණය**

| බදු වර්ග | 2013 | | 2014 | | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව රු.මිලි | % | එකතුව රු.මිලි | % | එකතුව රු.මිලි | % | එකතුව රු.මිලි | % | එකතුව රු.මිලි | % |
| ආදායම් බද්ද | 199,070 | 40.42 | 191,960 | 37.33 | 256,435 | 47.56 | 238,399 | 37.10 | 229,842 | 27.46 |
| ආර්ථික සේවා ගාස්තු | 6,596 | 1.34 | 6,155 | 1.2 | 6,148 | 1.1 | 20,458 | 3.19 | 44,720 | 5.34 |
| එකතු කළ අගය මත බද්ද | 217,687 | 44.2 | 237,915 | 46.27 | 214,237 | 38.23 | 283,451 | 44.18 | 443,739 | 53.05 |
| ඔට්ටු හා සූදු බද්ද | 592 | 0.12 | 815 | 0.16 | 832 | 0.15 | 1,884 | 0.29 | 1,929 | 0.24 |
| කොටස් හුවමාරු බද්ද | 1,197 | 0.24 | 2,048 | 0.4 | 1,395 | 0.25 | 738 | 0.12 | 1,334 | 0.16 |
| පිරිවැටුම් බද්ද | 218 | 0.04 | 472 | 0.09 | 16 | - | 17 | - | 20 | 0 |
| මුද්දර බද්ද | 6,884 | 1.4 | 7,918 | 1.54 | 11,596 | 2.07 | 10,651 | 0.67 | 11,377 | 1.36 |
| භාණ්ඩ හා සේවා බද්ද | 16 | - | 3 | - | 0.88 | - | 1.59 | - | 0.11 | 0 |
| ජාතික ආරක්ෂක බද්ද | 2 | - | 14 | - | 12 | - | 8 | - | 16 | 0 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 751 | 0.15 | 842 | 0.16 | 753 | 0.13 | 259 | 0.04 | 53 | 0.01 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 59,397 | 12.06 | 65,354 | 12.71 | 67,911 | 12.12 | 84,066 | 13.1 | 101,825 | 12.17 |
| ඉඩම් බද්ද | 97 | 0.02 | 579 | 0.11 | 1,066 | 0.19 | 23 | - | 7 | 0 |
| වාහන හිමිකම් බද්ද | - | - | - | - | - | - | 1,579 | 0.25 | 1,651 | 0.19 |
| විගමන බද්ද | - | - | - | - | - | - | 11 | - | 4 | 0 |
| සමාජ වගකීම් බද්ද | 32 | 0.01 | 85 | 0.02 | 20 | - | 1 | - | - | - |
| **මුළු රැස්කිරීම** | **492,539** | **100** | **514,160** | **100** | **560,422** | **100** | **641,546** | **100** | **836,517** | **100** |

**සටහන 10**

**2013 සිට 2017 දක්වා දේශීය ආදායම් රැස්කිරීම් බදු අනුව විශ්ලේෂණය**



# පරිච්ඡේදය 3

# වියදම් සහ

# ඵලදායිතා අනුපාතය

IRDSL

IRDSL

වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් මිලියන 4,337 ක් වූ අතර, පසුගිය වසරේ අගය වූ රුපියල් මිලියන 4,061 සමඟ සසඳා බැලීමේ දී එය 6.80% ක ඉහළයාමක් වාර්තා කරයි. මුළු වියදමෙන් 69.51% ක් හෙවත් රුපියල් මිලියන 3,015 ක් පුනරාවර්තන වියදම් සඳහා වැය කරන ලදි. 2016 වසරේ දී, අනුරූපී අගය රුපියල් මිලියන 2,841 ක් විය. වේතන සඳහා වූ වියදම 2016 වසරේ පැවති රුපියල් මිලියන 1,984 ට සාපේක්ෂව 5.98% කින් ඉහළ යාමකි. මුළු වියදමෙන් 48.49% ක් සහ පුනරාවර්තන වියදමෙන් 69.76% කින් සමන්විත වූ මෙම අගය විශාලතම තනි වියදම් අයිතමය විය.


2016 වර්ෂය හා සසඳා බලන කළ වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය 8.41% කින් වැඩිවීමක් වාර්තා කරන ලද අතර එය රුපියල් මිලියන 1,322 ක් විය. මෙම අගය 2016 වසරේ දී රුපියල් මිලියන 1,220 ක් විය. දෙපාර්තමේන්තුවේ මුළු වියදමෙන් 30.49% ක් ප්‍රාග්ධන වියදම් නියෝජනය කරයි.


අදාළ වර්ෂය තුළ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සඳහා කරන ලද ආයෝජනය රුපියල් මිලියන 1,068 ක් විය. නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂය තුළ දරන ලද වියදම රුපියල් මිලියන 12 කි.

### 3.1 **වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම් 2015, 2016 සහ 2017 වර්ෂ සමඟ සැසඳීම**

වගුව **3.1 - මුළු වියදම් 2015, 2016 සහ 2017**

| විස්තරය | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|
| | ( රු.'000 ) | % | ( රු.'000 ) | % | ( රු.'000 ) | % |
| <u>පුනරාවර්තන වියදම්</u> | | | | | | |
| පඩිනඩි | 1,783,351 | 40.19% | 1,984,484 | 48.87% | 2,103,065 | 48.49% |
| ගමන් වියදම් | 22,337 | 0.50% | 33,172 | 0.82% | 122,367 | 2.82% |
| සැපයුම් | 86,449 | 1.95% | 107,990 | 2.66% | 108,890 | 2.51% |
| නඩත්තු | 47,768 | 1.08% | 52,562 | 1.29% | 60,722 | 1.40% |
| කොන්ත්‍රාත් සේවා | 453,239 | 10.21% | 624,199 | 15.37% | 579,474 | 13.36% |
| පැවරුම් | 35,268 | 0.79% | 38,752 | 0.95% | 40,088 | 0.92% |
| උප එකතුව | **2,428,412** | **54.73%** | **2,841,159** | **69.96%** | **3,014,606** | **69.51%** |
| <u>ප්‍රාග්ධන වියදම්</u> | | | | | | |
| ප්‍රතිසංස්කරණ සහ වැඩි දියුණු කිරීම | 73,624 | 1.66% | 29,425 | 0.72% | 61,083 | 1.41% |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 31,820 | 0.72% | 27,130 | 0.67% | 53,439 | 1.23% |
| ධාරිතා ගොඩනැගීම | 385,170 | 8.68% | 55,031 | 1.36% | 127,817 | 2.95% |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | 1,518,108 | 34.21% | 1,108,385 | 27.29% | 1,067,931 | 24.62% |
| ආයෝජන (නව දේශීය ආදායම් පනත) | - | - | - | - | 12,290 | 0.28% |
| උප එකතුව | **2,008,722** | **45.27%** | **1,219,971** | **30.04%** | **1,322,560** | **30.49%** |
| මුළු එකතුව | **4,437,134** | **100.00%** | **4,061,130** | **100.00%** | **4,337,166** | **100.00%** |




## 3.2 ඵලදායිතා අනුපාතය

2017 වසරේ දී දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් මිලියන 4,337.16 ක් වූ අතර, රැස් කළ ආදායම රුපියල් මිලියන 836,577.70 ක් විය. එබැවින් ඵලදායිතා අනුපාතය (එනම් වියදම් කළ සෑම රුපියලක් සඳහාම රැස් කළ ආදායම) 193:1 ක් ලෙස ගණනය කෙරේ. එනම් රැස් කිරීමේ පිරිවැය, රුපියල් 100 ක් සඳහා ශත 52 ක් ලෙස ගණනය කෙරේ. රැස් කිරීමේ පිරිවැය; ආනයනයේ දී රැස් කරන ලද එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු හැර රුපියල් 100 ක් සඳහා ශත 68 ක් විය. (පෙර වර්ෂයේ දී අනුරූපී අගයන් පිළිවෙලින් ශත 63 සහ ශත 84 ක් විය.)

2015 - 2017 වසර දක්වා ආදායම් රැස් කිරීම, මුළු වියදම් සහ රැස් කිරීමේ පිරිවැය වර්ගීකරණයක් 3.2 වන වගුවෙහි දැක්වේ.

| වගුව 3.2 - ආදායම් රැස් කිරීම, මුළු වියදම හා රැස්කිරීමේ පිරිවැය ( රුපියල් මිලියන) | | | |
|---|---|---|---|
| විස්තරය | **2015** | **2016** | **2017** |
| <u>ආදායම් රැස් කිරීම</u> | | | |
| ආදායම් බද්ද | 256,434.94 | 238,398.61 | 229,841.81 |
| ආර්ථික සේවා ගාස්තුව | 6,148.45 | 20,458.17 | 44,719.76 |
| එකතු කළ අගය මත බද්ද | 214,236.99 | 283,451.51 | 443,739.47 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 67,911.06 | 84,066.53 | 101,824.56 |
| ඔට්ටු හා සූදු බද්ද | 831.92 | 1,884.50 | 1.929.03 |
| කොටස් ගනුදෙනු බද්ද | 1,394.92 | 737.66 | 1,333.90 |
| පිරිවැටුම් බද්ද | 15.77 | 16.64 | 20.75 |
| මුද්දර බද්ද | 11,595.88 | 10,650.97 | 11,377.13 |
| භාණ්ඩ හා සේවා බද්ද | 0.89 | 1.59 | 0.12 |
| ජාතික ආරක්ෂක බද්ද | 11.63 | 8.09 | 15.95 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 753.31 | 258.80 | 52.77 |
| ඉඩම් බද්ද | 1,066.64 | 22.66 | 7.38 |
| වාහන හිමිකම් බද්ද | - | 1,579.13 | 1,650.96 |
| විගමන බද්ද | - | 11.05 | 4.10 |
| සමාජ වගකීම් බද්ද | 19.96 | 0.84 | - |
| **මුළු එකතුව** | **560,422.36** | **641,546.75** | **836,517.69** |
| <u>පුනරාවර්ථන වියදම්</u> | | | |
| පඩිනඩි | 1,783.35 | 1,984.48 | 2,103.06 |
| ගමන් වියදම් | 22.34 | 33.17 | 122.37 |
| සැපයුම් හා උපකරණ | 86.45 | 107.99 | 108.89 |
| නඩත්තු හා අලුත්වැඩියා | 47.77 | 52.56 | 60.72 |
| සේවා | 453.24 | 624.20 | 579.47 |
| මාරු කිරීම් | 35.27 | 38.75 | 40.09 |
| <u>ප්‍රාග්ධන වියදම්</u> | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම් | 73.62 | 29.42 | 61.08 |
| අත්පත් කර ගැනීම් | 31.82 | 27.13 | 53.44 |
| ධාරිතා ගොඩනැගිලි | 385.17 | 55.03 | 127.82 |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | 1,518.11 | 1,108.39 | 1,067.93 |
| ආයෝජන (නව දේශීය ආදායම් පනත) | - | - | 12.29 |
| **මුළු වියදම** | **4,437.14** | **4,061.12** | **4,337.16** |
| | | | |
| රු. 100 බැගින් එකතු කිරීමේ පිරිවැය | **0.79** | **0.63** | **0.52** |
| ආනයන මත එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු හැර රු. 100 බැගින් එකතු කිරීමේ පිරිවැය | **0.98** | **0.84** | **0.68** |

## 3.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරන ලද විගණන වලට සියළු වියදම් එනම්, දෛනික වාහන ධාවන සටහන් (ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වා ගෙන යනු ලබන), පඩි ලැයිස්තු, වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා, බැංකු සැසඳුම් ප්‍රකාශන (මහජන බැංකුව, ලංකා බැංකුව සහ මහ බැංකුව) පරීක්ෂා කිරීම ඇතුළත් විය. තවද, මෙයට අතිරේක වශයෙන්, අගරු චෙක්පත්වල මුදල් අය කර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග, එකතුකළ අගය මත බදු සහ ආදායම් බදු වලින් ආපසු ගෙවීම්, අග්‍රිම ගිණුම් සහ අග්‍රිම මුදල් ගිණුම් පරීක්ෂා කිරීම අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

IRDSL

# පරිච්ඡේදය 4

# පැහැර හරින ලද බදු

IRDSL

IRDSL

## 4.1 පැහැර හරින ලද බදු

4.1 වන වගුවෙන් 2017.12.31 දිනට පැහැර හරින ලද බදු ප්‍රමාණය, අත්හිටවූ බදු ප්‍රමාණය, දණ්ඩන සහ රැස් කර ගත හැකි පැහැර හැර ඇති බදු ප්‍රමාණය නිරූපණය කරයි.

**වගුව 4.1 - පැහැර හරින ලද බදු විශ්ලේෂණය - 2017.12.31 දිනට**

| බදු වර්ගය | පැහැර හරින ලද දළ බද්ද (රු.) | දඩ මුදල (රු.) | දණ්ඩන හැර මතභේදයට තුඩු දුන් බදු (රු.) | මතභේදයට තුඩු දුන් බදු වලට අදාළ දණ්ඩන (රු.) | රැස් කළ හැකි බදු (රු.) | රැස් කළ හැකි දණ්ඩන (රු.) |
|---|---|---|---|---|---|---|
| ආදායම් බද්ද | 117,663,779,978 | 69,900,855,557 | 112,000,816,315 | 66,915,465,836 | 5,662,963,663 | 2,985,389,721 |
| ආදායම් බද්ද මත අධිභාරය | 258,960,780 | 165,710,940 | 225,044,714 | 163,763,121 | 3,916,066 | 1,947,819 |
| ආදායම් බද්ද (පොළිය මත රඳවා ගැනීමේ බදු) | 1,508,265,061 | 688,812,235 | 214,441, 597 | 91,808,201 | 1,293,823,464 | 597,004,034 |
| එකතු කළ අගය මත බද්ද | 50,350,479,988 | 38,913,961,644 | 42,597,804,741 | 32,783,899,407 | 7,752,675,247 | 6,130,062,237 |
| එකතු කළ අගය මත බද්ද (මූල්‍ය සේවා) | 7,643,997,409 | 4,153,954,002 | 7,609,732,579 | 4,118,186,802 | 34,264,830 | 35,767,200 |
| ආර්ථික සේවා ගාස්තු | 3,849,895,152 | 3,319,060,447 | 3,120,031,452 | 2,799,561,786 | 729,863,700 | 519,498,661 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 9,145,262,843 | 6,752,140,750 | 5,297,328,168 | 4,419,749,404 | 3,847,934,675 | 2,332,391,346 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (මූල්‍ය සේවා) | 391,312,502 | 190,590,856 | 383,119,329 | 186,520,478 | 8,193,173 | 4,070,378 |
| මුද්දර බද්ද | 9,732,724 | 4,866,362 | - | - | 9,732,724 | 4,866,362 |
| හර බද්ද | 2,215,581,368 | - | 2,215,581,368 | - | - | - |
| පිරිවැටුම් බද්ද | 1,722,835,502 | 863,949,677 | 1,722,835,502 | 863,949,677 | - | - |
| භාණ්ඩ හා සේවා බද්ද | 934,955,433 | 1,011,928,821 | 934,955,433 | 1,011,928,821 | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 1,267,057,545 | 529,265,383 | 1,267,057,545 | 529,265,383 | - | - |
| ජාතිය රැක නැගීමේ දායක මුදල | 14,286,141 | 4,471,485 | 14,286,141 | 4,471,485 | - | - |
| ධන බද්ද | 849,952 | 403,652 | 849,952 | 403,652 | - | - |
| ත්‍යාග බද්ද | 2,409 | 1,204 | 2,409 | 1,204 | - | - |
| සමාජ වගකීම් බද්ද | 1,848,479 | 146,995 | 1,848,424 | 146,995 | 55 | - |
| සමථයකට පත්වන දණ්ඩන | - | 252,837,716 | - | 137,202,448 | - | 115,635,268 |
| **එකතුව** | **196,979,103,266** | **126,752,957,726** | **177,635,735,669** | **114,026,324,700** | **19,343,367,597** | **12,726,633,026** |

සටහන:

i. අදාළ එක් එක් බදු වර්ගය යටතේ පවත්නා වූ සමුච්චිත ශේෂ ප්‍රමාණය මුළු හිඟබදු ප්‍රමාණය මගින් නියෝජනය කෙරේ. කෙසේ වෙතත්, ඉහත වර්ගීකරණය කර ඇති පරිදි නොගෙවූ බදු ඒ ස්වරූපයෙන් ම සම්පූර්ණයෙන් ම හිඟව නොපවතී.

ii. කවර වූ හේතුවක් මත තක්සේරුවක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී (බදු ගෙවන්නා විසින් වාර්තා ඉදිරිපත් නොකිරීම, වාර්තාව පදනම් කොට ගෙන බදු නොගෙවීම, සාවද්‍ය වාර්තා හෝ ප්‍රකාශ ඉදිරිපත් කිරීම යනාදී) නොගෙවූ හෝ හිඟ මුදලක් උද්ගත වේ. නියමිත දිනට බදු නොගෙවීම වෙනුවෙන් දණ්ඩන මුදල සාමාන්‍යයෙන් 10% ක් වන අතර, ආදායම් බදු

සම්බන්ධයෙන් එය 50% ක බදු ප්‍රමාණයක් කරා ළඟා වනතුරු නොගෙවන ලද සෑම මාසයක් සඳහාම 2% ක ප්‍රමාණයක් සහ එකතු කල අගය මත බදු සම්බන්ධයෙන් 100% ක ප්‍රමාණයක් වේ.

iii. තක්සේරු කිරීම්වලට එරෙහිව බදු ගෙවන්නන් විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී සහ ඉන් අනතුරුව ඔවුන් විසින් තම අභියාචනා අයිතිවාසිකම් සඳහා ඉල්ලුම් කර ඇති පරිදි නිරාකරණය කිරීම සිදු කරනු ලබන විට ඇතැම් නඩු අවස්ථා සම්බන්ධයෙන් ඉහළ අභියාචනා මට්ටම් දක්වා (අභියාචනා කොමිසම, අභියාචනාධිකරණය ආදිය) අදාළ බදු පැහැර හරින ලද බදු ලෙස සලකනු ලැබේ. මෙම බදු ප්‍රමාණයන් මතභේදයට තුඩු දුන් බදු, දණ්ඩන හෝ අත්හිටවූ බදු ලෙස වර්ගීකරණය කළ හැකි ය. අභියාචනා විසඳීමේ දී එකතු කරන ලද දණ්ඩන සමඟ තක්සේරු කළ යම් අතිරේක ප්‍රමාණය විසර්ජනය කළ යුතු වේ.

### 4.2 පැහැර හරින ලද බදු අඩු කිරීම සඳහා සැලසුම්

(අ) හිඟ බදු අය කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සහ පියවරයන්ම අදාළ ප්‍රඥප්තීන් හි දැක්වේ. තක්සේරු නිකුත් කිරීමෙන් එවැනි පියවර අඛණ්ඩව ගනු ලැබුව ද, සැලකිය යුතු බදු ප්‍රමාණයක් හිඟව පවත්නා බව ද දැක ගත හැකිය.

(ආ) 2010 අංක 16 දරන හිඟ බදු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි හිඟ බදු අය කර ගැනීමේ අංශය විසින් අදාළ හිඟ බදු වාර්තා පිළියෙල කර ඇති අතර, අතිරේක අධිකාරිත්වයක් සහිත ඵලදායී ලෙස බදු ආපසු අය කර ගැනීමේ කටයුතු තුළින් වඩාත් යහපත් ප්‍රතිඵල අපේක්ෂා කෙරේ. (යම් යම් අවස්ථාවන්හි දී හිඟ බදු අය කර ගැනීම සඳහා මෙන්ම ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කාරණා සම්බන්ධයෙන් විධිමත් සහ වේගවත් ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා වන පනතකි.)

### 4.3 හිඟ බදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම.

2010 අංක 16 දරන හිඟ බදු (විශේෂ විධිවිධාන) පනතෙහි 12 වන වගන්තිය ප්‍රකාරව, 2010 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් ලිත් වර්ෂයක අවසානය වන විට මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් නීතියක් යටතේ පැහැර හැර ඇති එහෙත් ඊට උපචිත වූ මුදලක් හෝ අත්හිට වූ හෝ විලම්භනය කරන ලද බදු මුදලක කොටස හැර, බදු වල මුළු එකතුව ඊට පෙරාතුව වූ වර්ෂයේ මුළු බදුවල එකතුවට වැඩි වන්නේ යම් ප්‍රමාණයකින් ද, එම බදු මුදල් ප්‍රමාණය එකී පෙරාතුවම වූ වර්ෂයේ එම නීතිය යටතේ පනවනු ලැබූ සහ නියම කරනු ලැබූ බදු වලින් සියයට තුනක් නොඉක්මවන බවට වගබලා ගැනීම කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

ඒ අනුව,

| | | |
|---|---|---|
| 2017.12.31 දිනට ශුද්ධ හිඟ බදු ප්‍රමාණය | - | රු. 19,343,367,597 |
| අඩු කළා | | |
| 2016.12.31 දිනට ශුද්ධ හිඟ බදු ප්‍රමාණය | | රු. 18,808,903,073 |
| 2017 වර්ෂයේ හිඟ බදු වැඩිවීම | | රු. 534,464,524 |
| 2016.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු බදු රැස්කිරීම් | - | රු. 604,252,568,053 |
| 2016 වර්ෂයේ මුළු බදු රැස්කිරීම් වලින් 3% | - | රු. 18,127,577,041 |

එබැවින්, 2017 වසරේ දී හිඟ බදු වල ශුද්ධ එකතු වීමක් දක්නට නොමැත. ඒ අනුව 2010 අංක 16 දරන හිඟ බදු (විශේෂ විධිවිධාන) පනතින් අපේක්ෂිත ආකාරයට එම අගය පෙර වර්ෂයේ මුළු බදු රැස් කිරීමෙන් 3% කට වඩා අඩු අගයක් ගනී.

# පරිච්ඡේදය 5

# විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා

IRDSL

IRDSL

## 5.1 විගණන

ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ඒකකයෙහි ස්වභාවය හා විශාලත්වයට අනුකූලව, සමස්ත බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව හැකි පමණ පුළුල් ලෙසින් ආවරණය කිරීමේ අරමුණින් යුතුව 2017 වසර තුළ දී විගණන සහ විමර්ශන කටයුතු සිදු කරන ලදි. කෙසේ වුවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිය විගණන කටයුතු ස්වයංක්‍රීයව ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය තවමත් ආරම්භක අවස්ථාවේ පවතින හෙයින්, සිදු කළ විගණන සංඛ්‍යාව සහ තක්සේරුකරණය හරහා රැස් කර ගත් ආදායම පසුගිය වසරට සාපේක්ෂව විශාල ලෙස අඩුවී ඇත. පිළිවෙලින් 5.1.1 වන සහ 5.1.2 වන වගුව මගින් විගණනයන්හි තොරතුරු සහ විගණනයන් හරහා එක් රැස් කර ගත් ආදායම පෙන්නුම් කරයි.

**වගුව 5.1.1 - වර්ෂය තුළ සිදුකරන ලද විගණන සහ අතිරේක බදු රැස් කිරීම පිළිබඳ විස්තර (රු.000)**

| | ආදායම් බද්ද | එ.අ.බ. | ආ.සේ.ගා. | උ.වි.ගෙ. | ජා.ගො.බ. | එකතුව |
|---|---|---|---|---|---|---|
| වර්ෂය තුළ තක්සේරු කරන ලද මුළු අතිරේක බදු ප්‍රමාණය | 4,372,703 | 434,383 | 25,069 | 8,255 | 158,583 | 4,998,993 |
| වර්ෂය තුළ රැස් කරන ලද මුළු අතිරේක බදු ප්‍රමාණය | 3,702,318 | 212,594 | 18,062 | 7,113 | 118,986 | 4,059,073 |
| 2017 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද විගණන සංඛ්‍යාව | 1,244 | | | | | |
| 2017 වර්ෂය තුළ දී අවසන් කරන ලද විගණන සංඛ්‍යාව | 1,221 | | | | | |

**වගුව 5.1.2 - සංස්ථාපිත සහ අනෙකුත් අංශ වලින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය (දණ්ඩන ඇතුළුව)**

| විස්තරය | තක්සේරු කරන ලද හා එකඟ වූ අතිරේක ආදායම / පිරිවැටුම (රු.) | තක්සේරු කරන ලද සහ එකඟ වූ අතිරේක බදු (රු.) | | | | (හිලව් කළ ආපසු ගෙවීම් ඉල්ලීම් ඇතුළුව) රැස් කරන ලද අතිරේක බදු (රු.) |
|---|---|---|---|---|---|---|
| | | සංස්ථාපිත විශාල බදු ගෙවන්නන් | සංස්ථාපිත අනෙකුත් | අනෙකුත් ඒකක | එකතුව | |
| ආදායම් බද්ද | 18,418,505 | 3,702,392 | 164,500 | 505,811 | 4,372,703 | 3,702,318 |
| එකතු කළ අගය මත බද්ද | 3,342,898 | 199,488 | 164,727 | 70,168 | 434,383 | 212,594 |
| ආර්ථික සේවා ගාස්තුව | 5,028,984 | 0 | 10,353 | 14,716 | 25,069 | 18,062 |
| උපයන විට ගෙවීම් | 50,231 | 1,243 | 7,012 | 0 | 8,255 | 7,113 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 11,541,003 | 25,673 | 58,881 | 74,029 | 158,583 | 118,986 |
| **එකතුව** | **38,381,621** | **3,928,796** | **405,473** | **664,724** | **4,998,993** | **4,059,073** |

## 5.2 අභියාචනා

තක්සේරුවලට එරෙහිව ලැබූ අභියාචනා 292 ක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ දී විසඳා අවසන් කරන ලද අතර අභියාචනා විශ්ලේෂණය කිරීමේ තත්ත්වය පහත සඳහන් පරිදි වේ.

| වගුව 5.2 - ලැබූ සහ සමථයකට කර කරන ලද අභියාචනා සම්බන්ධ විශ්ලේෂණය | | ආදායම් බද්ද | එකතු කළ අගය මත බද්ද | ආර්ථික සේවා ගාස්තු | ජාතිය ගොඩනැගීමේ බදු | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2017.01.01 දිනට ශේෂය | අභියාචනා හා විරෝධතා අංශය | 62 | 72 | 0 | 35 | 0 | 169 |
| | දේ.ආ.කො.ජ. විසින් අභියාචනා විභාග කිරීම | 82 | 100 | 0 | 81 | 2 | 265 |
| වර්ෂය තුළ දී ලියාපදිංචිය (APL 2 පරිදි) | | **322** | **271** | **16** | **171** | **16** | **796** |
| අවසන් කළ | නිර්ණය කරන ලද (දේ.ආ.කො.ජ.) | 36 | 60 | 0 | 60 | 1 | 157 |
| | අභියාචනා හා විරෝධතා අංශය | 39 | 74 | 1 | 21 | 0 | 135 |
| දේ.ආ.කො.ජ. ට විභාග කිරීම සඳහා ඉදිරිපත් කළා | | **46** | **91** | **0** | **63** | **1** | **201** |
| 2017.12.31 දිනට ශේෂය | අභියාචනා හා විරෝධතා අංශය | 300 | 166 | 15 | 135 | 5 | 162 |
| | දේ.ආ.කො.ජ. විසින් අභියාචනා විභාගයට භාජනය කිරීම | 78 | 118 | 0 | 70 | 1 | 267 |

## 5.3 අය ක්‍රියා මාර්ග

වර්ෂය තුළ හිඟ බදු අය කිරීම් සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග, හා නිවේදන සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

| වගුව 5.3 - අය ක්‍රියා මාර්ග | සිද්ධීන් | දැන්වීම් |
|---|---|---|
| තහනම් නියෝග නිකුත් කිරීම | 228 | 263 |
| නඩු පැවරීම් | 400 | 247 |
| වෙනත් ක්‍රියා මාර්ග | 2,131 | 1,956 |

## 5.4 ආපසු ගෙවීම්

වර්ෂය තුළ දී සිදු කරන ලද ආපසු ගෙවීම් පිළිබඳ විශ්ලේෂණය (හිඟ බදු සඳහා හිලව් කළ ආපසු ගෙවීම් හැර) පහත දැක්වේ.

| වගුව 5.4 - ආපසු ගෙවීම් විශ්ලේෂණ | **2016** | | **2017** | |
|---|---|---|---|---|
| බදු වර්ගය | ආපසු ගෙවීම් ප්‍රමාණය (රු.) | එක් එක් බදු වර්ගයේ රැස් කිරීම ශුද්ධ ආදායමට % | ආපසු ගෙවීම් ප්‍රමාණය (රු.) | එක් එක් බදු වර්ගයේ රැස් කිරීම ශුද්ධ ආදායමට % |
| එකතු කළ අගය මත බද්ද | 505,773,176 | 0.18% | 719,684,181 | 0.16% |
| සංස්ථාපිත ආදායම් බද්ද | 28,077,492 | 0.02% | 15,918,082 | 0.01% |
| වෙනත් සංස්ථාපිත නොවන බද්ද | 7,061,585 | 0.07% | 3,928,822 | 0.04% |
| නිශ්චිත ගාස්තු මත රඳවා ගැනීමේ බද්ද | 921,091 | 0.01% | - | 0.00% |
| උපයන විට ගෙවීමේ බද්ද | 28,634,229 | 0.10% | 24,786,377 | 0.08% |
| **එකතුව** | **570,467,573** | **0.19%** | **764,317,462** | **0.09%** |

# පරිච්ඡේදය 6

# ජාත්‍යන්තර සබඳතා

IRDSL

IRDSL

## 6.1 ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්

ආයෝජන ඇදගැනීමෙහි ලා ණය යාන්ත්‍රණය, විශේෂඥ දැනුම, නවීන තාක්ෂණය සහ රැකියා අවස්ථා ද්විත්ව බදු සම්මුතීන් හි අරමුණ හා අභිමතාර්ථය වන්නේ ජාත්‍යන්තර ක්‍රියාකාරකම් වලදී උපයා ගන්නා ආදායම් ද්විත්ව බදුකරණය අඩු කිරීම හෝ ඉවත් කිරීම හා ආදායම් පැහැර හැරීම වැළැක්වීම වේ. විදේශ ආයෝජන ඇදගැනීමෙහි ලා ණය යාන්ත්‍රණය, විශේෂඥ දැනුම, නවීන තාක්ෂණය සහ රැකියා අවස්ථා යනාදිය ලබාගැනීම පිණිස මග පෙන්වීම වැනි විවිධාකාරයෙන් මෙම ගිවිසුම් විශේෂ කාර්යයභාරයන් ඉටු කරන බැවින්, ඒවා සංවර්ධනය වෙමින් පවත්නා වූ රටවලට බෙහෙවින් සුවිශේෂී වේ.

මෙයට අතිරේක වශයෙන්, ශ්‍රී ලංකාවේ ඇතැම් ගිවිසුම් පාර්ශ්වකරුවන් සමඟ දැනටමත් ඇති කර ගෙන ඇති පරිදි, ගිවිසුමකට එළඹෙන රටවල් දෙක අතර සමගිය සහ සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා ද ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට එළඹෙනු ලැබේ.

පහත සඳහන් 6.1 වැනි වගුවේ දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාව 2017.12.31 දින වන විට රටවල් 44 ක් සමඟ ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට සහ බහු පාර්ශ්වීය ගිවිසුම්වලට එළැඹ තිබේ.

**වගුව 6.1 – 2017.12.31 දිනට ද්විත්ව බදු ගිවිසුම් බලපවත්නා රටවල්**

| | රට | ගිවිසුම් අත්සන් කළ දිනය | ගැසට් පත්‍රය | | ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වීම (තක්සේරු වර්ෂය අනුව) |
|---|---|---|---|---|---|
| | | | අංකය | දිනය | |
| 01 | ඕස්ට්‍රේලියාව | 1989 දෙසැ. 18 | 657/2 | 1991 අප්‍රේල් 08 | 1992/1993 |
| 02 | බංගලිදේශය | 1986 ජූලි 24 | 448/13 | 1987 අප්‍රේල් 07 | 1989/1990 |
| 03 | බහරේන් | 2011 ජූනි 24 | 1847/51 | 2014 ජන. 31 | 2015/2016 |
| 04 | බෙල්ජියම | 1983 පෙබ. 03 | 292/6 | 1984 අප්‍රේල් 09 | 1984/1985 |
| 05 | කැනඩාව | 1982 ජූනි 23 | 253/8 | 1983 ජූලි 13 | 1986/1987 |
| 06 | චීනය | 2003 අගෝ. 11 | 1374/20 | 2005 ජන. 06 | 2006/2007 |
| 07 | චෙකොස්ලොවේකියාව | 1979 පෙබ. 23 | 24/19 | 1979 පෙබ. 23 | 1979/1980 |
| 08 | ඩෙන්මාර්කය (සංශෝධිත) | 1981 දෙසැ. 22 | 228/15 | 1983 ජන. 20 | 1980/1981 |
| 09 | ප්‍රංශය | 1981 සැප්. 17 | 210/17 | 1982 සැප්. 17 | 1982/1983 |
| 10 | ෆින්ලන්තය | 1982 මැයි 18 | 253/8 | 1983 ජූලි 13 | 1981/1982 |
| 11 | ජර්මනිය | 1979 සැප්. 13 | 113 | 1980 ඔක්. 31 | 1982/1983 |
| 12 | හොංකොං (සීමිත) | 2004 මාර්තු 26 | 1374/21 | 2005 ජන. 06 | 2005/2006 |
| 13 | ඉන්දියාව (සංශෝධිත) | 2013 ජන. 22 | 1828/9 | 2013 සැප්. 17 | 2014/2015 |
| 14 | ඉන්දුනීසියාව | 1993 පෙබ. 03 | 789/10 | 1993 ඔක්. 21 | 1995/1996 |
| 15 | ඉරානය | 2000 ජූලි 25 | 1187/16 | 2001 ජූනි 06 | 2002/2003 |
| 16 | ඉතාලිය | 1984 මාර්තු 28 | 322/4 | 1984 නොවැ. 05 | 1978/1979 |
| 17 | ජපානය | 1967 දෙසැ. 12 | 14803/5 | 1968 මැයි 29 | 1969/1970 |
| 18 | කොරියාව | 1984 මැයි 28 | 342/11 | 1985 මාර්තු 29 | 1980/1981 |
| 19 | කුවේටය | 2002 පෙබ. 05 | 1245/19 | 2002 ජූලි 18 | 2002/2003 |
| 20 | මලයාසියාව (සංශෝධිත) | 1997 සැප්. 16 | 1028/21 | 1998 මැයි 22 | 1999/2000 |
| 21 | මොරිෂස් | 1996 මාර්තු 12 | 958/10 | 1997 ජන. 15 | 1998/1999 |
| 22 | නේපාලය | 1999 ජූලි 06 | 1116/6 | 2000 ජන. 26 | 2001/2002 |
| 23 | නෙදර්ලන්තය | 1982 නොවැ. 17 | 281/13 | 1984 ජන. 26 | 1979/1980 |
| 24 | නෝර්වේ (සංශෝධිත) | 1986 දෙසැ. 01 | 464/4 | 1987 ජූලි 27 | 1989/1990 |
| 25 | ඕමානය (සීමිත) | 1994 ජූලි 26 | 881/7 | 1995 ජූලි 26 | 1979/1980 |
| 26 | පකිස්ථානය (සංශෝධිත) | 1981 ඔක්. 15 | 210/17 | 1982 සැප්. 17 | 1983/1984 |
| 27 | පිලිපීනය | 2000 ඔක්. 11 | 1237/7<br>1256/27 | 2002 මැයි 21<br>2002 ඔක්. 02 | 2010/2011 |
| 28 | පෝලන්තය | 1980 අප්‍රේල් 25 | 130 | 1981 පෙබ. 27 | 1984/1985 |
| 29 | කටාර් | 2004 නොවැ. 07 | 1422/10 | 2005 දෙසැ. 05 | 2008/2009 |
| 30 | රුමේනියාව | 1984 ඔක්. 19 | 371/9 | 1985 ඔක්. 15 | 1986/1987 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 31 | රුසියාව | 1999 මාර්තු 02 | 1101/22 | 1999 ඔක්. 15 | 2003/2004 |
| 32 | සවුදි අරාබිය (සීමිත) | 1999 දෙසැ. 16 | 1101/23 | 1999 ඔක්. 15 | 1983/1984 |
| 33 | සිංගප්පූරුව (පැරණි) | 1979 මැයි 29 | 57/11 | 1979 ඔක්. 10 | 1977/1978 |
| | සිංගප්පූරුව (නව) | 2014 අප්‍රේල් 03 | 1993/11 | 2016 නොවැ. 16 | 2018/2019 |
| 34 | ස්වීඩනය | 1983 පෙබ. 23 | 297/28 | 1984 මැයි 18 | 1985/1986 |
| 35 | ස්විස්ටර්ලන්තය | 1983 ජන. 11 | 292/6 | 1984 අප්‍රේල් 09 | 1981/1982 |
| 36 | තායිලන්තය | 1988 දෙසැ. 14 | 571/16 | 1989 අගෝ. 18 | 1990/1991 |
| 37 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය (සීමිත) | 1992 ජූලි 07 | 824/13 | 1994 ජුනි 23 | 1979/1980 |
| | එක්සත් අරාබි එමීර් රාජ්‍යය (පූර්ණ) | 2003 සැප්. 24 | 1346/1 | 2004 ජුනි 21 | 2004/2005 |
| 38 | එක්සත් රාජධානිය | 1979 ජුනි 21 | 60/23 | 1979 නොවැ. 02 | 1977/1978 |
| 39 | අමෙරිකා එක්සත් ජනපදය (සංධානය) | 2002 සැප්. 20 | 1298/8 | 2003 ජූලි 21 | 2004/2005 |
| 40 | අමෙරිකා එක්සත් ජනපදය | 1985 මාර්තු 14 | 398/4 | 1986 අප්‍රේල් 22 | |
| 41 | වියට්නාමය | 2005 ඔක්. 26 | 1455/9 | 2006 ජූලි 24 | 2007/2008 |
| 42 | සීෂෙල්ස් | 2011 සැප්. 23 | 1837/14 | 2013 නොවැ. 20 | 2015/2016 |
| 43 | බෙලාරුස් | 2013 අගෝ. 26 | 1837/13 | 2013 නොවැ. 20 | 2015/2016 |
| 44 | පලස්තීනය | 2012 අප්‍රේල් 16 | 1838/8 | 2013 නොවැ. 26 | 2015/2016 |
| 45 | ලක්සම්බර්ග් | 2013 ජන. 31 | 1838/9 | 2013 නොවැ. 26 | 2015/2016 |
| | **බහුපාර්ශ්වීය ගිවිසුම්** | | | | |
| 01 | සාර්ක් බහුපාර්ශ්වීය ගිවිසුම | 2005 ඔක්. 13 | 1447/3 | 2006 මැයි 06 | 2011/2012 |

### 6.1.1 **2017 වර්ෂය තුළ ද්විත්ව බදු ගිවිසුම්වලට අදාළ කටයුතු**

<u>චෙක් ජනරජය සමඟ සංශෝධිත ගිවිසුම</u>

පළමු වටයේ සාකච්ඡාවක් 2017 අප්‍රේල් 25 සිට 28 දක්වා දිනයන්හි දී චෙක් ජනරජයේ ප්‍රාග් නුවර දී පැවැත්විණි.

<u>ස්විට්ස්ර්ලන්තය සමඟ සංශෝධිත ගිවිසුම</u>

දෙවන වටයේ සාකච්ඡාවක් 2017 ඔක්තෝම්බර් 24 සිට 27 දක්වා දිනයන්හි ශ්‍රී ලංකාවේ කොළඹ දී පැවැත්විණි.

තථ්‍ය ආර්ථිකමය යැපීමෙන් බදු පදනම ක්ෂය වීම හේතු කොට ගෙන අහිමි වන බදු ආදායමෙන් අනිසි බලපෑම් ඇති කරවන ශ්‍රී ලංකාව වැනි රටවලට වෙනත් විකල්පයක් නොමැති බැවින්, පදනම ඛාදනය සහ ලාභ විතැන් වීම (BEPS) යටතේ අවශ්‍යතා සහ අනාගතයේ දී බහු පාර්ශ්වික සාධන පත්‍ර (MLI) ඇතුළුව එහි ක්‍රියාවන් සමඟ අනුකූලවීමක් ලෙස දශක කිහිපයකට පෙර එළඹෙන ලද සම්මුති සංශෝධනය කිරීම වඩාත් සුවිශේෂී වේ.

## 6.2 විදේශයන්හි දී අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වයන්

| වගුව 6.2 - විදේශයන්හි දී අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වය | | | | |
|---|---|---|---|---|
| අංකය | නිලධාරියාගේ නම සහ තනතුර | වැඩ සටහන | රට | කාලපරිච්ඡේදය |
| 01 | කේ. දහනායක මහත්මිය<br>කොමසාරිස් ජනරාල් | වාර්ෂික කළමනාකරණ කමිටු රැස්වීම | එක්සත් රාජධානිය - ලන්ඩන් | 2017.04.18 - 2017.04.22 |
| 02 | කේ. දහනායක මහත්මිය<br>කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලංකාව හා චෙක් ජනරජය අතර ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා ගිවිසුම් සකස් කිරීමට අදාළව සාකච්ඡා | චෙක් ජනරජය -ප්‍රාග් | 2017.04.24 – 2017.05.01 |
| 03 | පී. රෝහිණී මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 2017 - OECD සංසදය | ප්‍රංශය-පැරිසිය | 2017.06.04 – 2017.06.10 |
| 04 | ආර්.එම්.පී.එස්.කේ. රාජපක්ෂ මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 2017 - OECD සංසදය | ප්‍රංශය-පැරිසිය | 2017.06.04 – 2017.06.10 |
| 05 | ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 38 වන CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | ඝානාව | 2017.11.05 – 2017.11.12 |
| 06 | සී.එච්. වීරසිංහ මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | BEPS අන්තර්ගත කාර්යරාමුව පිළිබඳව 2 වන රැස්වීම | ප්‍රංශය-පැරිසිය | 2017.01.24 – 2017.01.28 |
| 07 | එම්.එච්.ඩී. මුණසිංහ මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | බදු සහ අපරාධ පිළිබඳ පස්වන OECD සංසදය සහ බදු අපරාධ විමර්ශන ප්‍රධානීන්ගේ හතරවන සංසදය | එක්සත් රාජධානිය - ලන්ඩන් | 2017.11.05 – 2017.11.11 |
| 08 | ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ශ්‍රී ලංකාව හා චෙක් ජනරජය අතර ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා ගිවිසුම් සකස් කිරීමට අදාළ සාකච්ඡා | චෙක් ජනරජය -ප්‍රාග් | 2017.04.24 – 2017.05.01 |
| 09 | ඩබ්.එම්.පී.ජී.එන්.බී.වනිග සේකර මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 38 වන CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | ඝානාව | 2017.11.05 – 2017.11.12 |
| 10 | එම්.එල්.එම්. තාහිර් මයා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | අන්තර් ජාතික මූල්‍ය සංගමයේ 71 වන සමුළුව | බ්‍රසීලය | 2017.08.26 2017.09.03 |
| 11 | කේ.ඩී.එම්. රත්නකුමාර මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | VAT ගෝලීය සංසදය | ප්‍රංශය | 2017.04.10 2017.04.16 |
| 12 | ජී.සී. මහානාම මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | VAT ගෝලීය සංසදය | ප්‍රංශය-පැරිසිය | 2017.04.10 2017.04.16 |
| 13 | එස්.එස්.ඩී. වීරසේකර මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | VAT ගෝලීය සංසදය | ප්‍රංශය-පැරිසිය | 2017.04.10 2017.04.16 |

| | | | | |
|---|---|---|---|---|
| 14 | එම්.එස්.එම්. සියාන් මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | BEPS අන්තර්ගත කාර්යරාමුව පිළිබඳව 2 වන රැස්වීම | ප්‍රංශය-පැරිසිය | 2017.01.24<br>2017.01.28 |
| 15 | එම්.ඩී.ජේ.එම්. දේශප්‍රිය මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 38 වන CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | ඝානාව | 2017.11.05<br>2017.11.12 |
| 16 | ආර්.පී.එච්. ප්‍රනාන්දු මිය කොමසාරිස් | ශ්‍රී ලංකාව හා චෙක් ජනරජය අතර ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා ගිවිසුම් සකස් කිරීමට අදාළ සාකච්ඡා | චෙක් ජනරජය -ප්‍රාග් | 2017.04.24<br>2017.05.01 |
| 17 | ජේ.ඒ.ඩී.ඩී. ඩබ්ලිව්.කේ. සිරිවර්ධන මිය කොමසාරිස් | බදු ගිවිසුම් පිළිබඳ වැඩමුළුව, BEPS සන්දර්භයෙහි සහ MLI හි ඇති ගැටලු | මෙක්සිකෝව | 2017.04.22<br>2017.04.30 |
| 18 | ටී.යූ. අතුකෝරළ මහතා කොමසාරිස් | 38 වන CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | ඝානාව | 2017.11.05<br>2017.11.12 |
| 19 | ටී.එම්.එස්.එම්. තෙන්නකෝන් මිය කොමසාරිස් | බදු සහ අපරාධ පිළිබඳ පස්වන OECD සංසදය සහ බදු අපරාධ විමර්ශන ප්‍රධානීන්ගේ හතරවන සංසදය | එක්සත් රාජධානිය - ලන්ඩන් | 2017.11.05<br>2017.11.11 |
| 20 | එස්.ඕ.ඒ.සී.ආර්. නිවුන්හැල්ල මිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | බදු ගිවිසුම් පිළිබඳ වැඩමුළුව, BEPS සන්දර්භයෙහි සහ MLI හි ඇති ගැටලු | මෙක්සිකෝව | 2017.04.22<br>2017.04.30 |
| 21 | එල්.එම්. වසන්ත මහතා නියෝජ්‍ය කොමසාරිස් | Implementing BEPS | කොරියාව | 2017.04.16<br>2017.04.23 |
| 22 | ඩබ්ලිව්.ඒ.සී.එස්. සේනානායක මිය නියෝජ්‍ය කොමසාරිස් | වාර්ෂික කළමනාකරණ කමිටු රැස්වීම | එක්සත් රාජධානිය - ලන්ඩන් | 2017.04.18<br>2017.04.22 |
| 23 | ජී.එම්. ඉන්දික මහතා නියෝජ්‍ය කොමසාරිස් | අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ බදුකරණය සම්බන්ධයෙන් වැඩමුළුව | මැලේසියාව | 2017.08.06<br>2017.08.26 |
| 24 | සී.ඩී. ලොකුලියන මිය නියෝජ්‍ය කොමසාරිස් | අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ බදුකරණය සම්බන්ධයෙන් වැඩමුළුව | මැලේසියාව | 2017.08.06<br>2017.08.26 |
| 25 | එස්.ඒ.පී.ඩී. දිසාබණ්ඩාර මිය | ශ්‍රී ලංකාව හා චෙක් ජනරජය අතර ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා ගිවිසුම් සකස් කිරීමට අදාළ සාකච්ඡා | චෙක් ජනරජය -ප්‍රාග් | 2017.04.24<br>2017.05.01 |
| 26 | පී.එන්.එම්. පනාගොඩ මිය නියෝජ්‍ය කොමසාරිස් | TIWB වැඩමුළුව | ප්‍රංශය-පැරිසිය | 2017.11.01<br>2017.11.05 |
| 27 | කේ.පී.පී.එන්. කුමාරි මිය නියෝජ්‍ය කොමසාරිස් | BEPS ක්‍රියාවට නැංවීම | කොරියාව | 2017.04.16<br>2017.04.23 |
| 28 | වී.පී. හෙට්ටිආරච්චි මහතා | අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ බදුකරණය සම්බන්ධයෙන් වැඩමුළුව | මැලේසියාව | 2017.08.06<br>2017.08.26 |
| 29 | ජේ.එස්.යූ.වී. ද සිල්වා මහතා | අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ බදුකරණය සම්බන්ධයෙන් වැඩමුළුව | මැලේසියාව | 2017.08.06<br>2017.08.26 |
| 30 | සී.ජේ. ගුණරත්න මහත්මිය | ආසියානු රටවල් සඳහා වන ජාත්‍යන්තර බදුකරණය | ජපානය | 2017.05.08<br>2017.05.31 |
| 31 | ජේ.සී.බී. මනතුංග මහතා සහකාර කොමසාරිස් | LHDNM – OECD : බදු ගිවිසුම්-විශේෂ ගැටළු | මැලේසියාව | 2017.08.06<br>2017.08.26 |

# පරිච්ඡේදය 7

# ව්‍යවස්ථා සම්පාදනය

IRDSL

IRDSL

### 7.1 වසර තුළදී පනවන ලද ව්‍යවස්ථාවන්

**(i)** 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

(ii) 2017 අංක 07 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත

(iii) 2017 අංක 13 දරන ජාතිය ගොඩනැගීමේ (සංශෝධිත)බදු පනත

(IV) 2017 අංක 03 දරන ඉඩම් (ඉඩම් අන්සතු කිරීම මත සීමාවන්) (සංශෝධිත) පනත

### 7.2 අනුමත පුණ්‍යායතන

වර්ෂය තුළදී එක් අනුමැතියක් ලබා දී ඇත.

| පුණ්‍යායතනය | ගැසට් අංකය සහ ලියාපදිංචි දිනය |
|---|---|
| ආබාධිත දරුවන් සඳහා ලෝටස් හිල් නිවස | 2046/10<br>2017.11.12 |

### 7.3 ගැසට් නිවේදන

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලැබූ අදාළ පනත් යටතේ වර්ෂය තුළදී පහත සඳහන් ගැසට් නිවේදන නිකුත් කරන ලදි.

වගුව **7.1- 2017** වර්ෂය තුළදී ප්‍රසිද්ධියට පත්කරන ලද ගැසට් නිවේදන

| | ගැසට් අංකය | දිනය | විස්තර |
|---|---|---|---|
| I | 2006/37 | 2017.02.15 | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 212 සහ 217 වගන්තීන් යටතේ, 2006 අංක 01 දරන බලයලත් නියෝජිත නියමයන් |
| II | 2007/24 | 2017.02.21 | 2017.02.21 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අංක 1465/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මුද්දර ගාස්තු පනත (විශේෂ විධිවිධාන) යටතේ මත නියෝගයට පසු කරන ලද සංශෝධනය. |
| III | 2012/2 | 2017.03.27 | 2016 මැයි 02 දා සිට ක්‍රියාත්මක වන පරිදි තොග සහ සිල්ලර වෙළඳාම මත අගය මත එකතු කළ බද්ද සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයින් විසින් නඩත්තු කළ යුතු වාර්තාවන් සහ අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටීන් |
| IV | 2036/23 | 2017.09.13 | 2006 අංක 13 දරන ආර්ථික සේවා අය කිරීමේ පනතේ 2 වන වගන්තියට අනුකූලව සිදු කරන ලද නියමයන් |
| V | 2040/21 | 2017.10.26 | අගය මත එකතු කරන ලද බදු පනත යටතේ, 2017 අංක 01 දරන වාර්තා පවත්වාගෙන යෑමේ නියමයන් |

## 7.4 අර්ථ නිරූපණ කමිටුව

දේශීය ආදායම් පනතේ 208 අ වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2011 වසරේ පත් කරන ලද බදු නීති පිළිබඳ අර්ථ කථනය සඳහා වන කමිටුව (CITL) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වන අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයෙකුගේ සභාපතිත්වයෙන් යුක්ත වේ. මෙම කමිටුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පරිපාලනය කරනු ලබන පනත්වල විධිවිධාන අර්ථ නිරූපණයන්, පැහැදිලි කිරීම්, මාර්ගෝපදේශ යනාදිය නිකුත් කිරීම සඳහා බැඳී ඇත.

කවර හෝ තැනැත්තෙකුට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලිත පනතක විධිවිධානයන්හි ව්‍යාකූලතාවයක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් කමිටුවෙහි අර්ථ නිරූපණය ඉල්ලා සිටිය හැකි ය. (කමිටු ලේකම්, ලේකම් අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව) අර්ථ නිරූපණයන් සහ ක්‍රියාපටිපාටීන්ට අදාළව සමානාත්මතාවය සහතික වනු පිණිස අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපදෙස් නිකුත් කිරීම සඳහා මෙම කමිටුව වෙත බලය පවරා ඇත. අදාළ වර්ෂය තුළ දී අර්ථ නිරූපණ 33 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදි. මෙම කමිටුව මගින් ලබාදෙන ලද අර්ථ නිරූපණයන් පිළිබඳ විස්තර 7.2 වගුවෙන් දක්වා ඇත.

**වගුව 7.2 – 2017 වර්ෂය තුළ දී කමිටුව විසින් ලබාදෙන ලද අර්ථ නිරූපණයන් පිළිබඳ විස්තර**

| ක්ෂේත්‍රය | ආදායම් බදු | එකතු කළ අගය මත බද්ද | ජාතිය ගොඩනැගීමේ බද්ද | උපයන විට ගෙවීමේ බද්ද | ආර්ථික සේවා ගාස්තු බද්ද | එකතුව |
|---|---|---|---|---|---|---|
| ආදායම් බදු බැදියාව | 4 | 4 | 6 | - | 3 | 17 |
| ලාභාංශ | 1 | - | - | - | - | 1 |
| නිදහස් කිරීම් | 1 | 2 | - | - | - | 3 |
| සේවා නියුක්ත ආදායම | 1 | - | - | 2 | | 3 |
| සුදුසුකම් ලැබීමේ ගෙවීම් | 1 | - | - | - | - | 1 |
| නිර්වචන | 3 | - | 3 | - | | 6 |
| වියදම් හි අඩුකිරීම් | 1 | - | - | - | - | 1 |
| වෙනත් | 1 | - | - | - | - | 1 |
| **එකතුව** | **13** | **6** | **9** | **2** | **3** | **33** |

# පරිච්ඡේදය 8

# අනෙකුත් කාර්යයන්

IRDSL

IRDSL

## 8.1 බදු සේවා

බදු ගෙවන්නන් සහ මහජනතාව වෙත ඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින්, ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම යටතේ, බදු සේවා අංශය, ප්‍රාථමික ලියාපදිංචි අංශය සහ බදු උපකාරක සහ සංවර්ධන අංශය ලෙස කොටස් දෙකකට බෙදා වෙන් කර ඇත.

බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක (TIN), බදු අනු නියෝජිතයින් සහ පුද්ගලික හඳුනාගැනීමේ අංක (PIN) ලියාපදිංචි කිරීම ප්‍රාථමික ලියාපදිංචි අංකය විසින් සිදු කරයි. ප්‍රාථමික ලියාපදිංචි අංශය විසින් සිදු කරන ලද බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම පහත දක්වා ඇත.

| ලියාපදිංචි කිරීමේ වර්ගය | මාර්ගගත ලියාපදිංචිය | පැමිණ සිදු කරන ලියාපදිංචිය | බලාත්මක ලියාපදිංචිය |
|---|---|---|---|
| TIN ලියාපදිංචිය | 128 | 11,333 | 925 |
| PIN ලියාපදිංචිය | 1,732 | | |
| බදු අනුයෝජිතයින් ලියාපදිංචිය | 14 | | |

බදු ලියාපදිංචි කිරීමේ ඒකකය 2017 දී ආරම්භ කරන ලද අතර එමගින් විවිධාකාරයේ බදු වර්ග ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සපයයි. එලෙස සිදු කරන ලද නව ලියාපදිංචි කිරීම පහත දැක්වේ.

| එ.අ.බ. | ස.එ.අ.බ. | එ.අ.බ. තාවකාලික | ජා.ගො.බ. | ස.ආ.බ. | උ.වි.ගෙ. | ර.බ. | ආ.සේ.ගා. | හ.බ. | පු.ආ.බ. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2,610 | 342 | 23,088 | 5,448 | 4,192 | 1,239 | 220 | 835 | 2,366 | 1,377 |

බදු ගෙවන්නන්ගේ යහපත උදෙසා අත් පත්‍රිකා කිහිපයක් පිළියෙල කිරීමට යෙදුණි. එසේම, බදු ගෙවන්නන් සඳහා බදු උපදේශන සේවා මෙම බදු සේවා අංශය මගින් සලසා ඇත.

## 8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විධානයන් සහ නිෂ්කාශන සහතික පත් පිළිබඳ විස්තර

**වගුව 8.1 - දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විධානයන් හා නිෂ්කාශන සහතික**

| විස්තරය | 2016 | 2017 |
|---|---|---|
| **නිකුත් කරන ලද විධානයන්** | | |
| • පොළිය මත රඳවාගැනීම් බදු සඳහා බැංකු වෙත | 142 | 123 |
| **නිකුත් කරන ලද නිෂ්කාශන සහතිකපත්** | | |
| • රට හැර යන තැනැත්තන් සම්බන්ධයෙන් | - | 456 |
| **නිකුත් කරන ලද වරප්‍රසාද කාඩ්පත්** | | |
| • රන් කාඩ් පත් | 97 | 47 |
| • රිදී කාඩ් පත් | 78 | 24 |

## 8.3 මිල පැවරුම් නියෝග අංශය

අදාළ වර්ෂය තුළ දී මිල පැවරුම් ක්‍රමය පිළිබඳව දැනුම වැඩි දියුණු කර ගැනීම සහ විශ්ව මිල පැවරුම් ගැටළු අවබෝධ කරගැනීම පිණිස දෙපාර්තමේන්තුවේ විවිධ අංශයන් නියෝජනය වන පරිදි තෝරා ගනු ලැබූ නිලධාරීන් කණ්ඩායමක් සඳහා මිල පැවරුම් නියෝග අංශය මගින් සේවාස්ථ වැඩමුළු දෙකක් සංවිධානය කරන ලදි. ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වන සංවිධානයේ (OECD) සහාය ඇතිව පවත්වනු ලැබූ මෙම නේවාසික වැඩමුළු දෙක පසුගිය වසරේ පැවැති වැඩමුළුව අඛණ්ඩව පවත්වාගෙන යාමකි.

මීට අමතරව මෙම අංශය විසින් සේවාස්ථ වැඩමුළුවට සහභාගී වූ නිලධාරීන්ගේ සහාය සහිතව, දැනුම බෙදා හැරීමේ වැඩසටහනක් ලෙස, තෝරාගත් නිලධාරීන් 50 දෙනෙකුට ආයතනගත පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන වැඩමුළු 26 කින් සමන්විත වූ අතර එය සම්පූර්ණ කළ නිලධාරීන්ට සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී.

දෙපාර්තමේන්තුවේ විවිධ වූ තක්සේරු අංශයන් වෙතින් ලද සිද්ධීන් හතරක් සඳහා අසම්බන්ධිත මිල නිශ්චය කිරීම, මිල පැවරුම් නියෝග අංශයේ නිලධාරීන් විසින් අවසන් කර ඇත.

නව සංවර්ධන සහ නෛතික වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් මිල පැවරුම් සම්බන්ධයෙන් විස්තරාත්මක උපදෙස් මාලාවක් කෙටුම්පත් කර ඇත.

## 8.4 මානව සම්පත් සංවර්ධන අංශය

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පවත්වන ලද, පුහුණු වැඩසටහන්වලට අතිරේක වශයෙන් වසර තුළ දී බදු ගෙවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් මෙම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන අංශය මගින් සංවිධානය කරන ලදි.

**වගුව 8.2 - දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර**

| විෂය | ආයතනය | සහභාගි වූ පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| එ.අ.බ. සහ ජා.ගො. පිළිබඳ වැඩසටහන | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | 80 |
| අධ්‍යාපනවේදීන්ට සහ ශිෂ්‍යයන්ට බදුකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම. | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය, මරදාන | 50 |
| සම්පත් බැංකුව - මහව ශාඛාවෙහි අනුග්‍රහය මත කුඩා හා මධ්‍යම ව්‍යවසායක අංශය සඳහා බදුකරණය පිළිබඳව සම්මන්ත්‍රණය | මහව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 70 |
| කළමනාකරණ නිලධාරීන්, රජයේ ගණකාධිකාරීවරුන්හට බදු පිළිබඳ පුහුණු වැඩසටහන | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 100 |
| උපාධි අපේක්ෂක සිසුන්හට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | වයඹ විශ්වවිද්‍යාලය කුලියාපිටිය | 150 |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා මත්පැන් බලපත්‍රලාභී සංගමය සඳහා පවත්වන ලද එ.අ.බ. සහ අනෙකුත් සංශෝධන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන | මහනුවර | 200 |
| ශ්‍රී ලංකා මත්පැන් බලපත්‍රලාභී සංගමය සඳහා පවත්වන ලද එ.අ.බ. සහ අනෙකුත් සංශෝධන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන | ගම්පොල | 80 |
| ශ්‍රී ලංකා මත්පැන් බලපත්‍රලාභී සංගමය සඳහා පවත්වන ලද එ.අ.බ. සහ අනෙකුත් සංශෝධන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන | මාතර | 80 |
| සමූපකාර අංශය සඳහා පවත්වන ලද බදුකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | කුරුණෑගල | 68 |

IRDSL

IRDSL

# පරිච්ඡේදය 9

# ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS)

IRDSL

IRDSL

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය සරල කිරීමේ සහ බදු ගෙවන්නන් හට බදු අනුකූලතාවය වැඩි දියුණු කිරීමේ අරමුණින්, ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කරන ලදී. ආදායම් එකතු කිරීම වැඩි කිරීමට සහාය සැපයීම සහ කාර්යක්ෂම හා ඵලදායිතා ලෙස බදු ගෙවන්නන් වෙත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ළඟා වීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙන පරිදි බදු අනුකූලතාවයක් ඇති කිරීමට ද RAMIS හි අභිප්‍රායක් විය.

මෙම ව්‍යාපෘතිය නිල වශයෙන් 2014 ජූලි මස ආරම්භ වූ අතර එහි මෘදුකාංග සංවර්ධනකරු වූයේ සිංගප්පූරුවේ NCSI Solutions Pte Ltd සමාගමයි. RAMIS ව්‍යාපෘතිය අදියර 2 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබූ අතර පළමු අදියර 2016 මාර්තු මාසයේ ද, 2 වන අදියර 2016 ඔක්තෝබර් මාසයේ දී ද ක්‍රියාත්මක කිරීමට සම්පාදනය කෙරුණි.

පළමු අදියර තුළ සංස්ථාපිත ආදායම් බද්ද (CIT), එකතු කළ අගය මත බද්ද (VAT) රඳවා ගැනීමේ බද්ද (WHT), ජාතිය ගොඩ නැගීමේ බද්ද (NBT) සහ උපයන විට ගෙවීමේ බද්ද (PAYE) යනාදිය ඇතුළත් වූ අතර, එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායමින් 95% ක් ආවරණය කරයි. 2 වන අදියර තුළ සංස්ථාපිත නොවන ආදායම් බද්ද, හවුල් ව්‍යාපාර බද්ද, ආර්ථික සේවා ගාස්තුව (ESC), මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT FS) සහ ඔට්ටු සහ සූදු බදු (B&G) ඇතුළත් විය.

2017 වර්ෂය තුළ RAMIS ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වේ.

- මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT FS) ගෙවීමේ කටයුතු මෙම පද්ධතිය හරහා හඳුන්වා දීම 2017 අගෝස්තු මස සිදු කළ අතර මූල්‍ය සේවා බදු බැදියාව මත (VAT) සහ 2017 වර්ෂ සඳහා වාර්තා එකතු කිරීම සිදු කෙරෙනු ඇත.

- 2016 දී එළිදැක්වූ මොඩියුලයන්ට අමතරව, 2017 දී පුද්ගල ආදායම් බදු (IIT), හවුල් ව්‍යාපාර ආදායම් බදු (PIT) සහ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT FS) එළිදක්වනු ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා සහ උපලේඛන ඉදිරිපත් කිරීම විද්‍යුද්ගත අනුසාරයෙන් සිදු කිරීමට අවස්ථාව 2017 නොවැම්බර් මස සිට උදා වුණි.

- අතින් තෝරා ගත් සංසිද්ධි විගණනය කිරීම සහ අවදානම් විගණන තෝරා ගැනීම සඳහා විගණන මොඩියුලයක් හඳුන්වා දුන් අතර, ජාතිය ගොඩනැගීමේ බදු සහ උපයන විට ගෙවීමේ බදු වර්ග සඳහා සවිස්තරාත්මක විගණන සංසිද්ධීන් පද්ධතිය හරහා සිදු කරන ලදී.

- ගෙවීම් පැහැර හැර ඇති බදු එකතු කිරීමේ මොඩියුලයන් වර්ෂය තුළ දී නිකුත් කරන ලදී.

- සම්පූර්ණ කර නොමැති සංසිද්ධීන් සඳහා පද්ධතිය හරහා කටයුතු කිරීම 2017 වසරේ සිට ආරම්භ කෙරුණි.

- බදු අනුයෝජිතයින් ලියාපදිංචි කිරීම (බලයෙලත් නියෝජිතවරුන්, අනුමත ගණකාධිකාරිවරු) 2017 වර්ෂය තුළ දී ආරම්භ කෙරුණි.

තව ද බදු ගෙවන්නන්, පරිශීලකයින් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිලධාරීන් හට වැඩ කටයුතු වඩාත් ප්‍රියමානප ලෙස සිදු කර ගෙන යාමට ඉවහල් වන පරිදි, RAMIS ව්‍යාපෘතියේ වෙනස්කම් සිදු කළ යුතු ක්ෂේත්‍රයන් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ දී හඳුනා ගෙන ඇත. වර්ෂය තුළ දී සමහර වෙනස්කම් ක්‍රියාත්මක කළ අතර අපේක්ෂිත පරිදි ආදායම් එක්රැස් කිරීමේ කාර්යයන් වෙත ළඟාවීමට දේශීය ආදායම් නිලධාරීන් සතුව ඇති ඵලදායිතාව තව දුරටත් වැඩි දියුණු කිරීමේ අරමුණින් කාර්ය ප්‍රවාහ වෙනස්කම් වැනි ප්‍රතිපත්තිමය වෙනස් කම් මධ්‍ය කාලීනව ක්‍රියාත්මක කිරීම වැඩ කටයුතු යොදා ඇත.

වර්ෂ 2013 දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS ව්‍යාපෘතිය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරීමට මූලික පියවර ගැණිනි. වර්ෂ 2014 දී ආරම්භක වාර්තාව සැකසීම, අවශ්‍යතා එක්රැස් කිරීම, වලංගුභාවය සහ ව්‍යාපාර ක්‍රියාවලිය නැවත ඉංජිනේරු ශිල්පයන් ලක් කිරීම සම්පූර්ණ කෙරුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය භාෂා තුනෙන්ම සැකසීම 2015 දී සිදු කෙරුණි. එම වර්ෂයේදී ම ආරම්භ කළ, පළමු අදියර සඳහා වන පරිශීලක පරිග්‍රාහක සවර්ධන පරීක්ෂණ කටයුතු නිම කිරීමට හැකිවුණි.

RAMIS හි ක්‍රියාකාරකම් වර්ෂ 2016 දී ආරම්භ වුනි. RAMIS පද්ධතිය යටතේ බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම 2016 පෙබරවාරි මස ආරම්භ කළ අතර e - ලියාපදිංචි කිරීමේ පහසුකම් මාර්තු මාසයේ සිට ඇරඹුනි. මෙම e - සේවාව හරහා එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩ නැගීමේ බදු උපයන විට ගෙවීමේ බදු, රඳවා ගැනීමේ බදු සහ සංස්ථාපිත ආදායම මත බදු වාර්තා ඉදිරිපත් කිරීමේ පහසුකම්, බදු ගෙවන්නන් හට සලස දෙන ලදී. ඒකතු කළ අගය මත බදු, උපයන විට ගෙවීමේ බදු, රඳවා ගැනීමේ බදු යනාදිය සමග ඉදිරිපත් කළ යුතු උපලේඛන e - සේවාව සමඟ හඳුන්වා දී ඇත.

RAMIS ව්‍යාපෘතියේ ඵලදායිතාව වැඩි දියුණු කිරීමේ අරමුණින් ව්‍යාපාරිකයින්, ප්‍රාදේශීය කාර්යාලයන් සහ මෙම පද්ධතියේ ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්හි නියුතු කාර්ය මණ්ඩලය සඳහා මෙම පද්ධතියේ ප්‍රතිලාභ සහ අදාළ සේවාවන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

IRDSL